# මුල් ඓතිහාසික අවධියේ පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය ආශ්‍රිත සමාජ පුරාවිද්‍යාව (උතුරු මැද පළාත ඇසුරින් සිදු කරන විමර්ශනයක්)

තුසිත මැන්දිස් [1]

***ABSTRACT***

***The current study is mainly focusing on the social structure established in protohistoric Anuradhapura. Specially, the role of Parumaka, Gahapathi, Gamika, Baratha, Ect are discused in here.These social groups were active on agriculture, irrigation, precious stones and mettalogy industry as well as administration. Their activities were highly influential on emrgence of Anuradhapura as an urban centre, and development of whole culture and the landscape of the region. The present paper focusing on this matter widely.***

## හැඳින්වීම (Introduction)

අනුරාධපුර යුගකරණය අනුව මුල් ඓතිහාසික අවධිය (Early historic). ක්‍රි.පූ. 250 - ක්‍රි.ව. 100 අතර කාලයට අයත් වේ (Deraniyagala 1992:712). නමුත් පොදුවේ ගත් කළ ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 100 අතර කාල පරාසය ලෙස පිළිගනු ලබයි (Seneviratne 1996:279). මෙම අවධිය සම්බන්ධ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩ නැඟීමේ දී ඒ හා සම්බන්ධ සමාජ පුරාවිද්‍යාව (Social Archaeology) බෙහෙවින් ම වැදගත් වේ. මුල් ඓතිහාසික අවධියේ දී අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ මෙන් ම පර්යන්ත ප්‍රදේශය තුළ ඇති වූ සමාජ පසුබිම

[1]**Dr.Thusitha Mendis. Senior Lecturer, BA(Hons)in Archaeology (PDN), PGDip in Archeology (PGIAR-KLN),PGDip in Monument Conservation and Heritage Management (PGIAR-KLN) M.phil in Archeaology (PGIAR-KLN),Phd (PGIAR-KLN)MSLCA,Department of Archaeology and Heritage Management. E-mail: thus.mendis@gmail.com**

හඳුනාගැනීමේ දී එම සමාජ සැකැස්ම දේශපාලන, සමාජ, ආගමික, ආර්ථික යන ආයතන තුළින් හඳුනාගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය සම්බන්ධ සමාජ පුරාවිද්‍යා අධ්‍යයන සිදුකර ඇති පූර්ව පර්යේෂකයන් එම අධ්‍යයන සඳහා අභිලේඛන පාර්ශවය කෙරෙහි නැඹුරුතාවකින් මෙන් ම අභිලේඛන හා පුරාවිද්‍යාත්මක පාර්ශවය කෙරෙහි නැඹුරුතාවයක් සහිතව අධ්‍යයන සිදුකර ඇති බව පෙනේ. එම විද්වතුන් අතර සෙනරත් පරණවිතාන, ඩී. එම්. නිකලස්, හේම එල්ලාවල, එස්. කේ. සිත්‍රම්පලම්, ලක්ෂ්මන් එස් පෙරේරා, ආර්. මහින්ද කරුණානායක, සුදර්ශන් සෙනෙවිරත්න, රාජ් සෝමදේව යන වියත්හු ප්‍රමුඛ වෙති. ඔවුන්ගේ අධ්‍යයනයන් තුළින් ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධියේ දී සමාජ නායකත්වය, පාලන සංවිධාන, සම්පත් පරිහරණය, විශේෂ ප්‍රාගුණ්‍යතාවය, වාණිජ කටයුතු ආදී වූ විවිධ විෂය පරාස දක්වා ජන සමාජයේ විහිදීම හඳුනාගෙන තිබීම අතිශයින් ම වැදගත් වේ.

## සමාජ සැකැස්ම

මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය, විශේෂයෙන් ම උතුරු මැද පළාත ආශ්‍රයෙන් පවතින අභිලේඛන තොරතුරු උපයෝගී කරගැනීම මඟින් වඩා සාර්ථක ලෙස ගොඩ නගා ගත හැකි ය. මූලික ලෙස මුල් ඓතිහාසික සමයේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳ ව සාකච්ඡා කිරීම තුළින් එවකට පැවති සමාජ සැකැස්ම, හා ඔවුන්ගේ කාර්යභාර්ය පිළිබඳ ව වැදගත් තොරතුරු සමුදායක් ග්‍රහණය කර ගැනීමට අවකාශ සැලසේ. ඒ අතරින් ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය සාහිත්‍ය ලේඛනවල අඩංගු නොවන ගමණි, ගමික, පරුමක, ගහපති, බත, බරත, අශ/අය ආදී විවිධ පදවි නාම දැරූ ජන කණ්ඩායම් ද විවිධ ශිල්ප කටයුතුවල දී විශේෂ ප්‍රාගුණ්‍යතාවය දැක් වූ ජන කණ්ඩයාම් පිළිබඳ ව ද පූර්ව බ්‍රාහ්මී අභිලේඛනවල කරුණු අන්තර්ගත වන බව පරණවිතාන හා ලක්ෂ්මන් පෙරේරා විසින් සඳහන් කර ඇත (*Ic.Vo.*i 1970: xvi – cxxix; Perera 1962:241-248).

බ්‍රාහ්මී අභිලේඛනවල ස්ථානගතවීම සිතියමක් ආශ්‍රයෙන් විමර්ශනය කළහොත් දළ වශයෙන් 1298 ක් ශ්‍රී ලංකාවේ පවතින බව හඳුනාගෙන තිබේ (*Ic. Vol* i.1970. xvi ). එම ලිපි ප්‍රමාණය පළාත් අනුව වර්ග කිරීමේ දී උතුරුමැද පළාත තුළින් මුල් බ්‍රාහ්මී ලිපි 402 ක් පවතින බව හඳුනාගත හැකිය (*එම* 1-25, 79-93). උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය ගත් කළ පවතින ලිපි ප්‍රමාණය දළ වශයෙන් 335 වේ (*එම*). ශ්‍රී ලංකාවේ පළාත් අනුව මුල් බ්‍රාහ්මී ලිපි ගණනය කළහොත් උතුරුමැද පළාතේ වැඩි ම ප්‍රමාණයක් පවතින බව හඳුනාගත හැකිය.

(බලන්න වගු අංක 01)

| පළාත | අභිලේඛන ප්‍රමාණය |
|---|---|
| උතුරුමැද | 402 |
| උතුර | 56 |
| නැගෙනහිර | 202 |
| දකුණ | 163 |
| ඌව | 63 |
| සබරගමුව | 44 |
| මධ්‍යම | 84 |
| වයඹ | 278 |
| බස්නාහිර | 05 |
| එකතුව | 1298 |

*වගු අංක 01*

*පළාත් අනුව පූර්ව බ්‍රාහ්මී ලිපිවල ස්ථානගත වීම* *(Ic. Vol:1970).*

මුල් බ්‍රාහ්මී ලිපි ආශ්‍රිත පළාත් වර්ගීකරණය අනුව පූර්ව ඓතිහාසික අවධියේ ජන කණ්ඩායම් සඳහා උතුරුමැද පළාත ආකර්ශනය වූවා මෙන් ම මුල් ඓතිහාසික අවධිය තුළ දී ද උතුරුමැද පළාත ආකර්ශනය වී ඇති බව පැහැදිලි වේ. පූර්ව බ්‍රාහ්මී ලිපි 402 ක් උතුරුමැද පළාත තුළ ස්ථානගත වුව ද පුරාණ අනුරාධපුර නාගරික ව්‍යුහයට අදාළ ව අරය කි.මී. 5 ක වර්ග කිලෝ මීටර් 40 ක භූමි කලාපය තුළින් හඳුනාගත හැක්කේ පූර්ව බ්‍රාහ්මී ලිපි 47 ක් පමණි (එම 6-8). එම ලිපි වෙස්සගිරිය, අභයගිරිය, රුවන්වැලි සෑ මළුව යන ස්ථානවල ස්ථානගත ව තිබේ. එයින් වෙස්සගිරිය තුළ ලිපි 23 ක් (*Ic. vol* i.1970: 6-7) පවතින බව පුරාණවිද්‍යා වාර්තා කොට තිබේ. නමුත් 2006 වර්ෂයේ නව ලිපි 04 ක් පියතිස්ස සේනානායක වාර්තා කොට ඇත (සේනානායක 2008: 90/96). ඒ අනුව වෙස්සගිරියේ මුළු ලිපි ප්‍රමාණය 27 ක් ලෙස සැලකිය යුතුය. මෙයට අමතර ව අභයගිරියේ ලිපි 04 ක් හා රුවන්වැලි සෑ දාගැබ් මළුවේ ලිපි 14 ක් වශයෙන් මුළු ලිපි ප්‍රමාණය 47 ක් ලෙස හඳුනාගත හැකිය .

පුරාණ නාගරික ප්‍රදේශයේ ස්ථානගත වන මුල් බ්‍රාහ්මී ලිපිවලින් හඳුනා ගත හැකි පදවි නාම, සමාජ නාම, ආර්ථික නාම හා ආගමික නාම අතර *පරුමක, සෝත්‍රුත්තර කුලහ, ගහපති, ගන, උපසික, බරත, බත, ගමික, වුඩ, තලදර, රජ* ආදී වශයෙන් යුත් කණ්ඩායම් හඳුනාගත හැකිය. මෙම අභිලේඛන තුළින් සමාජ, ආර්ථික දේශපාලන හා ආගම යන සමාජ සැකැස්මට අයත් ජන කණ්ඩායම් පිළිබඳ තොරතුරු වාර්තා වන නිසා ඔවුන්ගේ කාර්යභාරය අනුරාධපුර පුළුල් භූ දර්ශනය සඳහා වැදගත් වී ඇත්තේ කෙසේදැයි විමර්ශනය කිරීමට අවකාශ සැලසේ. මුල් බ්‍රාහ්මී

ලිපිවල වර්ධනය අතින් මුල් ඓතිහාසික අවධිය තුළ උතුරුමැද පළාත අනෙක් පළාත් වලට වඩා ප්‍රමුඛත්වයට පත් වී ඇති බව 01වන වගුවට අනුව පැහැදිලි වන බැවින් පුරාණයේ දී උතුරු මැද පළාත තුළ වැඩි ජන සංඝත්වයක් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. ජනගහන වර්ධනය හා ජනසනත්වය රාජ්‍ය බිහිවීම සඳහා බලපානු ලබන කාරණයක් මෙන් ම සමාජීය හා ආර්ථික කටයුතු වර්ධනය කෙරෙහි ද බලපාන කරුණක් බව ගුණවර්ධන පෙන්වා දී තිබේ (Gunawardana 1981 : 133-134). විශේෂයෙන් ම උතුරු මැද පළාතේ මුල් බ්‍රාහ්මී ලිපිවල ස්ථානගත වීමේ සංඝත්වයක් පුරාණයේ දී පෙන්නුම් කරන ලද නිසා එම පළාත පුරාණයේ වැඩි ජනගහණයක් විසූ පළාත වීමට ඇතැයි ද පෙන්වා දිය හැකිය. උතුරු මැද පළාත තුළ මුල් ඓතිහාසික අවධියේ සමාජ සැකැස්ම හඳුනාගැනීමට ද මුල් හා අපර බ්‍රාහ්මී ලිපි උපකාර කරගත හැකි වේ. එහි දී එක් එක් ජන කණ්ඩායම්හි සංඝත්වය හඳුනාගැනීමට ද හැකියාව ලැබේ. (බලන්න වගු අංක 02)

| පදවි නාම අනුව ජන කණ්ඩායම් | පූර්ව බ්‍රාහ්මී ලිපි ප්‍රමාණය |
|---|---|
| රජ/මහරජ | 26 |
| පරුමක | 114 |
| ගහපති | 23 |
| බත | 29 |
| බරත | 37 |
| අය /අස/අශ | 07 |
| ගමික | 25 |

*වගු අංක 02*

*මුල් ඓතිහාසික යුගයේ උතුරුමැද පළාතේ ජන කණ්ඩායම්හි සංඝත්වය දැක්වෙන වගුව (IC. Vol:1970).*

ඉහත වගුවේ සඳහන් දත්තවලට අනුව උතුරුමැද පළාත ආශ්‍රිත මුල් බ්‍රාහ්මී අභිලේඛනවල ස්ථානගත වීම මිහින්තලය, වෙස්සගිරිය, අභයගිරිය, රුවන්වැලිසෑය, රදාගම, බිල්ලෑවෙලගල, ආඬියාගල, ඔක්කම්පිටිකලු, තන්තිරිමලය, රස්නකවැව, විහාරහමිල්ලෑව, හඳගල විහාර, මහාකපුගොල්ලෑව, වලස්කුණුවැව, කුඩාඅඹගස්වැව, අලියාකඩ, වේගොල්ලකඩ, බෙරවාගම, මඩගමකන්ද, බ්‍රහ්මණයාගම, වඳකහගල, පුලියංකඩ, දියතිත්ත වැව, නැට්ටුක්කන්ද, ගල්කන්දේගල, කොටකන්ද, දෙබලගල, බඹරහෙල, මහකනදරාව, දුනුමඬලාකන්ද, තලගුරු විහාර, කුට්ටිකුලම, තෝනිගල, කෝසවකන්ද, මානකන්ද, මරදන්කඩවල, වනසිංහ විහාර, පෙරුමාමඩුකන්ද, බුද්ගේහින්න, යාන්ගල, පතික්කාන්කුලම, මුරුතගනිම්කන්ද, මහඇලගමුව, හිත්තරගමහින්න, රිටිගල, ගල්කන්ද, දිඹුලාගල, කොනත්තේගොඩගල, දේවගල්ලේගල, මුතුගල, කන්ඩකාඩු,

කුරුනෑකල්ලු, ලුනුවරනගල, ආඩියාගල, ගල්ගේ, හඳගල, කෝසවකන්ද, අවුකන ආදී ස්ථාන ඇසුරෙන් හඳුනාගත හැකිය (*Ic. vol*I,1-25).

උතුරුමැද පළාතේ පුළුල් භෞමික ක්ෂේත්‍රය තුළට පූර්ව ඓතිහාසික (proto) අවධියේ ආදිත ම ජන ඇතුළුවීම් ක්‍රි.පූ. 900 තරම් ඈත කාලයක සිදු වී තිබේ (Deraniayagala 1992-709). මෙම ජන කණ්ඩායම් බහු සම්පත් යැපුම් රටාව අනුගමනය කරන ලද අර්ධ - ස්ථාවර කණ්ඩායම් විය. ඔවුන්ගේ ජනාවාස ව්‍යාප්ත වීම හා සංස්කෘතියේ වර්ධනය ක්‍රි.පූ. 900 සිට ක්‍රි.පූ. 300 දක්වා කාලයක් තුළ සිදු වී ඇත (Seneviratne 1996-279). ක්‍රි.පූ.300 න් අනතුරු ව ශ්‍රී ලංකාවේ මුල් බැස ගනු ලැබූ මුල් ඓතිහාසික සංස්කෘතිය පූර්ව ඓතිහාසික සංස්කෘතියේ ප්‍රතිච්ඡින්න පැතිකඩක් බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (*එම*). මුල් ඓතිහාසික සංස්කෘතික පිරිස උතුරු මැද පළාත තුළ පූර්ව ඓතිහාසික ජනාවාස හා සුසාන පිහිටි ස්ථානවල මෙන් ම ඊටත් වඩා සාර්ව වූ භූ කලාපයක ව්‍යාප්ත ව සිටි බව අභිලේඛන සාධක මඟින් හඳුනා ගත හැකිය (*එම*).

මුල් ඓතිහාසික අවධියේ සමාජ පුරාවිද්‍යාව මඟින් හඳුනාගත හැකි තොරතුරු අතර ක්ෂුද්‍ර හා සාර්ව ආකාරයට සිදු කරනු ලැබූ සම්පත් අත්පත් කර ගැනීම, නිෂ්පාදන බෙදාහැරීම් ඇතුළු විශේෂ වාණිජ කටයුතු, ගබඩා හා කාසි සංසරණය, ශ්‍රම විභජනය හා තොටුපළ හා කෘෂිකාර්මික කටයුතු විශේෂ ප්‍රාගුණ්‍යකින් යුක්තව සිදුකර ඇති බව හඳුනාගත හැකිය. එම කාර්යයන් අනුරාධපුර පුළුල් භූ දර්ශනය සඳහා ලබා දී ඇති දායකත්වය පිළිබඳ ව කරුණු විමර්ශනය කිරීමේ දී එක් එක් ජන කණ්ඩායම් හි කාර්ය භාරය හඳුනා ගැනීම අතිශයින් ම වැදගත් වේ.

## *පරුමක වරුන්ගේ කාර්යය භාරය*

මුල් ඓතිහාසික අවධියේ උතුරුමැද පළාතේ ජීවත් වූ ජන කණ්ඩායම් අතර වැඩි ම ජන සනත්වයක් පෙන්නුම් කරන ජන කණ්ඩායම ලෙස *පරුමක* ජන කණ්ඩායම හඳුනාගත හැකිය. මොවුන්ගේ කාර්ය භාරය යථෝක්ත කාල පරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික කටයුතු, වාණිජ කටයුතු, පාලන කටයුතු හා විවිධ ශිල්ප කටයුතු ඇතුළු විශාල ක්ෂේත්‍රයක් පුරා විහිදී තිබූ බව මුල් බ්‍රාහ්මී අභිලේඛන තොරතුරු අනුව පැහැදිලි වේ. ඒ අනුව අනුරාධපුර පුළුල් භූ දර්ශනයේ අවකාශය ගොඩනැඟීමේ දී අනෙකුත් ජන කණ්ඩායම්වලට වඩා පුළුල් දායකත්වය ඔවුන් දක්වා තිබේ.

පරුමකවරු හා ඔවුන්ගේ කාර්යාවලිය පිළිබඳ සමාජ පුරවිද්‍යා අධ්‍යයනයට පසුබිම සැකසෙනුයේ විවිධ විද්වතුන් විසින් ඒ සම්බන්ධ ව සිදු කර ඇති අධ්‍යයන් තුළින් ය. පරුමකවරු සම්බන්ධ මුල් ම අධ්‍යයනයන් පී. ගෝල්ඩන් ස්මිත් විසින් සිදු කර තිබෙන අතර ඔහු විසින් රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවට ලියන ලද ලිපියක් මඟින්

පරුමකවරු යනු බ්‍රාහ්මණයන් විය හැකි යැයි අදහස් පළ කර ඇත. (*JCBRAS*.no, 20. 1879:02). එසේ ම H. C. P. බෙල් විසින් පරුමක යනු ප්‍රධාන (Chief) යන අරුත ගැබ් වූ පදවි නාමයක් බව පෙන්වා දී එය සංස්කෘත (*ප්‍රමුඛ*) සිංහල (*පාමොක්*), දෙමළ (*පෙරුමකන්*) යනුවෙන් භාවිත වන බව විග්‍රහ කර ඇත (*ASCAR*,1892:69). මෙය අතිශයින් වැදගත් විග්‍රහ කිරීමක් වන අතර මෙම අර්ථ විවරණය සමාජ පුරාවිද්‍යා අධ්‍යයනයන් සඳහා පූර්වාදර්ශයක් සපයා ඇත. පරුමකවරු සම්බන්ධ ව විග්‍රහ කර ඇති පරණවිතාන ඉන්දීය - ආර්යය පුරෝගාමී පරපුරකට අයත් විශේෂ කණ්ඩායමක් වශයෙන් ඔවුන් අර්ථ දක්වති (*Ic.Vol* I. 1970:lxxxiv). පරුමක ජන කණ්ඩායම පිළිබඳ ව විග්‍රහ කරන සුදර්ශන් සෙනෙවිරත්න ඔවුන් දකුණු ඉන්දීය ජන සම්භවයක් සහිත ජන කණ්ඩායමක් බව පැහැදිලි කර ඇත (Seneviratne 1989,105). ඔහුගේ විග්‍රහයට අනුව *පෙරු* (Peru) යන්නෙන් "*මහා*"හෝ "*විශිෂ්ට*" යන්න ගම්‍ය වන බවත්, *මකන්* (Makan) යන්නෙන් *මහා පුරුෂයා හෝ පැවතෙන්නා* (Great Man) ගම්‍ය වන බවත් පෙන්වා දෙයි. *(එම)* සෙනෙවිරත්න ඔවුන් ප්‍රාග් නාගරික සමාජයක ප්‍රධාන කණ්ඩායමක් වී ඇති බව ද විස්තර කර ඇත. (*එම*). මෙම ජන කණ්ඩායමේ සම්භවය සම්බන්ධ ව විග්‍රහ කර ඇති සෙනෙවිරත්න පරුමකවරුන්ට අයත් ශිලා ලිපිවල දැකගත හැකි බ්‍රාහ්මී නොවන සංකේත අනුව පරුමකවරුන්ගේ මූලය පූර්ව ඓතිහාසික අවධියට සම්බන්ධ වීමට පවතින ඉඩකඩ වැඩි බව ප්‍රකාශ කොට ඇත (*එම*: 103-110). පරුමක ජන කණ්ඩායම පිළිබඳ විග්‍රහ කරන පරණවිතාන "රජ" හා මහරජ යන පදවි නාම සම්බන්ධ කරමින් "*මපරුමක*", "*මපුරුමුකා*", "*මපුරුමු*" යන නාම සමඟ සම්බන්ධ වන බව පෙන්වා දී ඇත (*Ic. Vol.* i 1970 : lxxiv). පරණවිතාන එමඟින් උත්සාහ දරා ඇත්තේ පරුමකවරු ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ ආදිත ම ජන කණ්ඩායමේ නායකයන් වන බව පෙන්වීමට ය (*එම*).

එසේ ම පරුමකවරු සම්බන්ධ විමර්ශනයක් සිදු කර ඇති R. A. L. H. ගුණවර්ධන බ්‍රාහ්මී අභිලේඛන පරීක්ෂා කොට බලා ශ්‍රී ලංකාවේ දැකගත හැකි *ගමණි, පරුමක, ගපති* වැනි තනතුරු තුළින් සමාජ ශ්‍රේණිගත වීමක් පෙන්නුම් කරන අතර, එම තනතුරුවලින් සමාජ දේශපලන තත්ත්වය (Socio– Political Status) හඳුනාගත හැකි බව පෙන්වා දී ඇත (Gunawardena 1981:70-88). පරුමකවරුන්ගේ සමාජ දේශපාලන ශ්‍රේණිගතවීම භික්ෂූන්ට පිදූ ලෙන් ලිපිවල සඳහන් නාමයන්ගෙන් තහවුරු වන අතර එයින් 28% ක් පමණ ප්‍රධාන පරුමකවරුන්ට අයත් වන බැවින් ඔවුන්ගේ සමාජ, ආර්ථික තත්ත්වය ප්‍රබල ස්ථානයක පැවති බව හඳුනා ගැනීමට හැකිය. ඒ අනුව පරුමකවරු වංශ ප්‍රධානීන් (Head of the clean group) හෝ ප්‍රධානීන් (Chief) ලෙස මුල් ඓතිහාසික අවධියේ කටයුතු කරන්නට ඇතැයි ඔහු පෙන්වා දී ඇත (*එම*:27).

ශ්‍රී ලංකාවේ මුල් බ්‍රාහ්මී අභිලේඛනවල සඳහන් වන පරුමකවරු සම්බන්ධ ව විග්‍රහ කර ඇති එස්. කේ. සිත්‍රම්පලම් පරුමකවරු සමකාලීන සමාජයේ ප්‍රමුඛත්වයක් හිමි කර ගත් පිරිසක් බව පෙන්වා දී තිබේ (Sitrampalam 1982:13). ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන ඉතිහාසය හැදෑරීමේ දී පරුමක පදවි නාමය හඳුනා ගැනීමට දමිළ සංගම් සාහිත්‍ය උපයෝගී කර ගන්නා සිත්‍රම්පලම් බෙල් දක්වන *ප්‍රමුඛ* හෝ *පාමොක්ඛයන්තෙන් පරුමක* යන්න ව්‍යවහාරයට පැමිණ ඇතැයි යන අදහස් බැහැර කරයි (*එම*). ඔහු විග්‍රහ කර ඇති ආකාරයට පරුමක යන්න සංගම් සාහිත්‍යයේ එන *පෙරුමකන්* හෝ *පරුමකන්* යන්නට සමාන බව පෙන්වා දෙයි. ඔහුගේ මතයට අනුව පරුමක පදවි නාමය සඳහන් ලිපිවලට අයත් සංකේත පූර්ව ඓතිහාසික අවධියේ මැටි බඳුන් මත ඇති සංකේතවලට සමානකමක් පවතින බැවින්, එමඟින් දකුණු ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පුරාණයේ සිට පැවති සම්බන්ධතා පුරාවිද්‍යාත්මක වශයෙන් තහවුරු වන බව පෙන්වා දී ඇත. එම නිසා පරුමක නාමයට ද්‍රවිඩ භාෂා මූලයක් පවතින බව පෙන්වා දීමට ඔහු උත්සාහ ගෙන ඇත (*එම* :16-18).

සුදර්ශන් සෙනෙවිරත්න හා සිත්‍රම්පලම් ඉදිරිපත් කර ඇති ප්‍රබල මත අතර පරුමකවරු සම්බන්ධ අඛණ්ඩ ඉතිහාසය පූර්ව ඓතිහාසික අවධිය දක්වා දිව යන බව පුරාවිද්‍යාත්මක කැරුණුවලින් ද යම් මට්ටමකට තහවුරු වී ඇත. සෙනෙවිරත්නගේ මතය අනුව පරුමක කණ්ඩායමේ ඉස්මතු වීම පූර්ව ඓතිහාසික අවධියේ දකුණු ඉන්දියාවේ ඇති වූ දේශපාලන නායකත්වය හා අධිකාරීත්වය පිළිබිඹු කරන බවත් එමඟින් ශ්‍රී ලංකාවේ පූර්ව රාජ්‍ය කෙරෙහි *වේලිර්* ප්‍රධානීන්ගේ නායකත්වය යටතේ බලපෑමක් කරන්නට පරුමකවරු ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන්නට ඇතැයි පෙන්වා දී ඇත (Seneviratne 1995:164). මෙය වඩාත් තාර්කික මතයක් ලෙස සමාජ පුරාවිද්‍යාව දෙස අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වේ .

පරුමකවරුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව වැඩි දුරටත් අදහස් දක්වා ඇති සෙනෙවිරත්න පූර්ව රාජ්‍ය සමයේ දී යුධකාමී වතාවරණයක් සමාජය තුළ ඇති වූයෙන් පරුමකවරු සමාජයේ ප්‍රධාන පුද්ගලයින් (Bigman) බවට පත්වන්නට ඇති බව පෙන්වා දෙයි (Seneviratne 1989:108). මෙහි දී ඔවුන් වංශ කණ්ඩායම් තුළ අධිකාරීත්වයක් පිහිටුවා ගනිමින් ඉතා ම සීමිත ප්‍රදේශවල දේශපාලන බලයක් ද අත්පත් කර ගෙන සිටින්නට ඇතැයි ප්‍රකාශකොට ඇත (*එම*). එසේ ම ක්‍රි.පූ. 3 වන සියවස වන විට නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් ද වාසිදායක තත්ත්වයන් පරුමකවරු අත්පත් කරගත සිටි බව භික්ෂූන්ට පූජා කර ඇති පරිත්‍යාගවලින් පෙනෙන බැවින් (*එම* :116) වංශ නායකයන්ගේ දේශපාලන තත්ත්වය හා සම්පත්වල අයිතිය අනෙක් නායකත්වයන්ට වඩා පෙන්නුම් කිරීමක් *රජ* හා *අය* වැනි පදවි ඔවුන් භාවිත කිරීමෙන් පැහැදිලි වන බව සෙනෙවිරත්න ගේ මතයයි (*එම*).

උතුරුමැද පළාතේ පරුමක ශිලා ලිපි ස්ථානගත වීමේ රටාව දෙස බැලීමේදී එම ලිපි පූර්ව ඓතිහාසික (Proto) ජනාවාස හා සුසාන ආශ්‍රිත බහුල ව්‍යාප්තියක් ගෙනහැර දක්වන බව පෙනේ (එම :114). පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස උතුරුමැද වියළි තැනිතලා ආශ්‍රිත ස්ථානගතවීම සඳහා එහි ඇති ස්වභාවික පරිසරය හා ස්වභාවික ඛනිජ වර්ගවල උපයෝගීතාවය බලපා ඇති සේම එම කාරණාම මුල් ඓතිහාසික අවධියේ දී උතුරුමැද ආකර්ශනීය භූමි වීමට බලපා ඇත. විශේෂයෙන් ම මෙහිදී ජන ලේඛනය හා කලාපීය වර්ධනය හඳුනා ගැනීමේ දී ආකර්ශනීය ප්‍රදේශ ආශ්‍රයෙන් මුල් ඓතිහාසික ප්‍රජාවගෙන් වැඩි ව්‍යාප්තියක් හඳුනාගත හැකිය.

උතුරු මැද විස්තෘත කලාපයේ ආකර්ශනීය භූමි වශයෙන් අනුරාධපුරයට නැගෙනහිර පර්යන්ත ප්‍රදේශය හා අනුරාධපුරයට දකුණු දිගින් පිහිටි පර්යන්ත ප්‍රදේශය වැදගත් වූ බව මුල් බ්‍රාහ්මී අභිලේඛනවල බහුල ව්‍යාප්තිය අනුව හඳුනාගත හැකිය. එම භූමි ආකර්ශනය වී ඇත්තේ ඛනිජ, ලෝහ හා කුළුබඩු ආශ්‍රිත ද්‍රව්‍යයන්ගේ ස්ථානගත විම නිසා බව පෙනේ. මුල් ඓතිහාසික අවධියේ නගුල් කෘෂිකර්මාන්තය ඇතුළු වාරි කටයුතු සඳහා ඇති වූ සුවිශේෂ තත්ත්වය මත පරුමකවරු ඒ සඳහා දැක් වූ දායකත්වය කැපී පෙනේ. උතුරුමැද පළාතේ කෘෂිකර්මාන්තයට වඩා හිතකර රතු දුඹුරු පාංශු කලාපයේ යෝග්‍යතාවය මත වැව් භාරකරුවන්, තොටුපළ පාලනය කරන්නන්, නගුල මෙහෙයවන්නන්, වැව් භූමි පාලකයන් ආදී වශයෙන් විවිධ කෘෂි කටයුතුවල ඔවුන් නියැලී ඇති බව මුල් බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී අභිලේඛන අනුව හඳුනාගත හැකිය. (බලන්න වගු අංක 03)

| මුල් හා අපර බ්‍රාහ්මී ශිලා ලිපි පවතින ස්ථානය | වාර්තා ගත වූ යොමු අංකය | කෘෂිකර්ම කටයුත්ත හා පරුමකවරයාගේ දායකත්වය |
|---|---|---|
| රිටිගල මරක්කල උල්පත | *ibid* : no 260 | පරුමක නගුලි (මු.බ්‍රා) (නගුල මෙහෙයවන්නා) |
| සීගිරිය | *ibid* : no 869 | පරුමක නගුලි (මු.බ්‍රා.) (නගුල මෙහෙයවන්නා) |
| හඳගල | *ibid*:no 1130,1132 | පරුමක වපි හමික (අ.බ්‍රා) (වැව් භාරකරු) |
| අවුකන | *ibid* : no 1149 | පරුමක තණ භූමික භොජික (අ.බ්‍රා.) (තණ භූමි පාලකයා) |
| අවුකන | *ibid* :no 1150 | පරුමක භූමික භොජික (අ.බ්‍රා.) (භූමි පාලක) |
| අවුකන | *ibid* : no 1151 | පරුමක කඩපි වපි හමික (අ.බ්‍රා.) (වැව් භාරකරු) |

| | | |
|---|---|---|
| අවුකන | *ibid* : no 1153 | පරුමක ගජ ද බුතක වපිහමි (අ.බ්‍රා.) (වැව් භාරකරු) |
| තෝරව මයිලෑව | *ibid* : No 1217 | පරුමක වව් හමික (අ.බ්‍රා.) (වැව් භාරකැර) |
| තෝරව මයිලෑව | *ibid* : no 1218 | පරුමක වැව් හමික(අ.බ්‍රා.) (වැව් භාරකරු) |
| බෙරවාගම | *ibid* : no 142 | පරුමකවියගහ(මු.බ්‍රා.) (සීසෑම කටයුතු භාරකරු) |
| කන්දලම | *ibid* : no 860 | පරුමක තොට බොජික (මු.බ්‍රා.)(තොටුපළ පාලනය කරන්නා) |

*වගු අංක 03(Ic.vol.1:1970)*

*උතුරු මැද පළාතේ පරුමක වරුන්ගේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු දැක්වෙන වගු*

කෘෂි කටයුතුවලට අමතර ව පාලන කටයුතු මෙන් ම නගර කර්මාන්ත ශිල්ප හා වෙළදාම සඳහා ද උතුරු මැද පළාත ඇසුරෙන් පරුමකවරුන්ගේ මැදිහත්වීම පහත සඳහන් වගුව මඟින් පෙන්වා දිය හැකි ය. (බලන්න වගු අංක 04)

| මුල් බ්‍රාහ්මී ශිලා ලිපිය වාර්තා වන ස්ථානය | ලිපිය වාර්තා වූ යොමු අංකය | නගර කර්මාන්තය, ශිල්ප හා වෙළඳම ඇතුළු කාර්යයන් |
|---|---|---|
| මිහින්තලය | (*Ic.Vo.*i 1970): no 22 | පරුමක බඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය | *එම* :no. 44 | පරුමක චුඩ (මැණික්කරු) |
| මිහින්තලය රාජගිරි කන්ද | *එම* :no.59 | පරුමකබඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය රාජගිරි කන්ද | *එම* :no.63 | පරුමකබඩගරික (භාණ්ඩාගාරික) |
| මිහින්තලය රාජගිරි කන්ද | *එම* :no.64 | පරුමකබඩගරික (භාණ්ඩාගාරික) |
| හඳගල විහාරය | *එම* :no.125 | පරුමක චුඩ (මැණික්කරු) |
| බුදුගේහින්න | *එම* :no.203 | පරුමක චුඩ (මැණික්කරු) |
| රිටිගල | *එම*:no.251 | පරුමකමහාසේනාපති(මහසෙන්පති) |
| රිටිගල | *එම*:no.266 | පරුමක චුඩ නගහ (චූඩ නාග) |
| කුරුනෑකල්ලු | *එම* :no.319 | පරුමක තබර(තඹකරු) |
| කුරුනෑකල්ලු | *එම*:no.320 | පරුමක පුකියත(වෙළඳ කුලය) |

| | | |
|---|---|---|
| තෝරව මයිලෑව | *එම*:no.1037 | පරුමකනගරබොජක (නගරයේ අයබඳු එකතු කරන්නා) |
| තෝරව මයිලෑව | *එම* :no.1219 | පරුමකනගරගුත (නගර පාලක) |
| ගලකන්දේගම | *එම* :no.171 | පරුමක බොජික(ගම් පාලකයා හා අයබඳුඑකතු කරන්නා) |
| ගල්කන්දේගම | *එම* :no.172 | පරුමක බොජික(ගම් පාලකයා හා අයබඳුඑකතු කරන්නා) |
| මහඅලගමුව | *එම*:no.217 | පරුමකගනක(ගණන් තබන්නා) |
| මහඅලගමුව | *එම* :no.230 | පරුමකනගරගුත (නගර පාලක) |

*වගු අංක 04(Ic.vol.1.:1970) .*

*උතුරු මැද පළාතේ පරුමකවරුන්ගේ නගර, කර්මාන්ත,*

*ශිල්ප හා වෙළඳ කටයුතු පිළිබඳ තොරතුරු ඇතුළත් වගුව*

උතුරුමැද පළාතේ පරුමක පදවි නාමය දැරූ ජන කණ්ඩායම් මෙන් ම ගමික හා ගහපති, ජන කණ්ඩායම් ද මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර පූළුල් හූ දර්ශනය ගොඩ නැගීම සඳහා දායකත්වය දක්වා තිබේ. ඔවුන් පරුමකවරුන් මෙන් ම පාලන වෙළඳ ශිල්ප හා කර්මාන්ත සම්බන්ධ කටයුතුවල නියැලී ඇති අකාරයට පහත සඳහන් වගුව මඟින් හඳුනාගත හැකි ය (බලන්න වගු අංක 5). මේ අනුව මුල් ඓතිහාසික සමයේ උතුරුමැද පළාතේ ජන සමාජය පිළිබඳ ව අධ්‍යයනයේ දී සමාජ ස්තරගත වීම හා ශ්‍රේණිගත වීම හඳුනා ගත හැකි ය. සමාජ ස්තරගතවීමක් යනු පාලන සංවිධානයක් බිහිවීමේ සාධකයන් බව ක්ලැසන් හා ස්කැලිනික පෙන්වා දී ඇත (Clereassenand Skalnik 1978 :545-546). ජන සමාජයක ජන කොටස් අතර ඇති වන්නා වූ මෙම ස්තරගතවීම ආර්ථික හා සමාජ කරුණු රැසක බලපෑම මත සිදුවන බව ද ඔහු පෙන්වා දී ඇත (*එම*). ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය තුළ දී මෙම සමාජ ස්තරගතවීම ඉතා පැහැදිලි ලෙස හඳුනාගත හැකි අතර එහි දී *මහරජ, රජ, පරුමක, ගමණි, ගමික, ගහපති, බරත, බත, අය, අශ, උපසක, කුටුබික* ආදී වශයෙන් වන්නා වූ පදවිය ප්‍රමුඛ කරගෙන ඇති වූ ස්තරගත වීම මුල් හා අපර බ්‍රාහ්මී අභිලේඛන ඇසුරෙන් පැහැදිලි ව ම හඳුනාගත හැකිය (*Ic.* Vol. i 1970:xivi-cxxix).

| ශිලාලිපිය වාර්තාවන ස්ථානය | ලිපිය වාර්තා වූ යොමු අංකය | උතුරුමැද පළාතේ ගමික, ගහපති, කණ්ඩායම්වල කාර්යභාරය |
|---|---|---|
| මිහින්තලය | *Ic.Vol*i no. 39 | ගමික බඩගරික (භාණ්ඩාගාරික) |
| මුතුගල | එම no.309 | ගමිකතොඩික(තොටුපල පාලක) |
| කන්දේගම කන්ද | එම :no.295 | ගහපති දූතක (දූතසේවාව) |
| කන්දේගම කන්ද | එම :no.297 | ගහපති චුඩික (මැණික්කරු) |
| මුතුගල | එම :no.301 | ගහපති කබර (යකඩකරු) |

*වගු අංක 05*

*උතුරුමැද පළාත තුළ ගහපති හා ගමිකවරුන් ගේ කාර්යභාර්ය*

*(Ic.Vol.1.1970:xivi-cxxix) දැක්වෙන වගුව*

මුල් ඓතිහාසික අවධියට අයත් උතුරුමැද පළාත තුළින් හඳුනා ගත හැකි සමාජ ස්තරායනය තුළින් සංස්කෘතික භූ දර්ශනය අධ්‍යයනයෙහිලා ප්‍රධාන වන ජන කණ්ඩයාම් කිහිපයක් හඳුනාගත හැකි ය. එම ජන කණ්ඩායම් අතර ප්‍රමුඛත්වයෙහිලා පරුමකවරුන්ගේ කාර්යභාරය වැදගත් වේ. එය එසේ වන්නේ උතුරු මැද පළාත් තුළින් පරුමකවරුන්ට අයත් වැඩි ම මුල් හා අපර බ්‍රාහ්මී ශිලා ලිපි වාර්තා වීම නිසා ය. අභිලේඛනවල ව්‍යාප්තිය අනුව අනෙක් ජන කණ්ඩායම්වලට වඩා වැඩි ව්‍යාප්තියක් පරුමක කණ්ඩායම තුළින් දැකගත හැකි ය. එබැවින් ජන ඝණත්වය අනුව ද ඔවුන්ගේ වැඩිවීමක් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. පරුමකවරු කවුරුන් ද? ඔවුන්ගේ සමාජ පසුබිම කෙබඳු ද ? ඔවුන් දේශපාලන සංස්ථාව හා සමාජ සංස්ථාව තුළ කිනම් කටයුතු සිදු කර තිබේ ද? යන කරුණු පිළිබඳව විමර්ශනය කිරීමෙන් ඔවුන් ගේ කාර්යය භාර්යය හඳුනාගත හැකිවේ. පරුමකවරු සම්බන්ධව අධ්‍යයනය සිදුකරන ලද උගතුන් අතර ගෝල්ඩ් ස්මිත් (Gold Schmidt 1879:02), බෙල් (Bell 1890 :08), පරණවිතාන (Paranavitane 1936:447; *Ic.Vol* i 1970), පෙරේරා (Perera 1951:79-86) එල්ලාවල (එල්ලාවල 1967:25), හෙට්ටිආරච්චි (Hettiarachchy 1972:69-70), ගුණවර්ධන (Gunawardana 1971:24), වේලුපිල්ලෙයි (Vellupillai 1980 :8-18), එස්. කේ. සිත්‍රම්පලම් (Sitramppalam 1978:89-98), කරුණාතිලක(Karunathilaka 1983 :125-128), සුදර්ශන් සෙනෙවිරත්න (Seneviratne 1989 :99-132) ප්‍රධාන වේ.

පරුමකවරුන්ගේ කාර්යය පිළිබඳ මුල් බ්‍රාහ්මී ශිලාලිපිවල සඳහන් කරණු සැලකිල්ලට ගැනීමේ දී ඔවුන් පුරාතන ජන සමාජය තුළ කෘෂි ක්ෂේත්‍ර ඇසුරින් පමණක් නොව විවිධ ක්ෂේත්‍ර සඳහා නායකත්වය සපයා ඇති බව හඳුනාගත හැකිය. ඒ අතර දේශපාලන, ආර්ථික, ශිල්ප හා කර්මාන්ත කටයුතු ප්‍රමුඛ වේ. උතුරු මැද පළාත තුළින් හඳුනාගත හැකි

සමාජ සංවිධාන කටයුතු අතර නගර හා ගම් පාලන කටයුතු විශේෂ වේ. ඔවුන් (*නගර බොජික*), නගර පාලක මෙන් ම (*බොජික*) ගම් පාලනය සම්බන්ධ ව කටයුතු කළ බව කුරුනෑකල්ලු, තෝරවමයිලෑව, ගල්කන්දේගම හා මහා ඇලගමුව ආදී උතුරුමැද පළාත පුරා විසිරී පවතින මුල් ඓතිහාසික අභිලේඛන තුළින් හඳුනාගත හැකිය (*Ic.Vol.* i 1970 no.171, no. 172, no. 217, no. 230, no. 1037). නගර හා ගම් පාලනය මෙන් ම යුධ හමුදා නායකත්වය ද යුධ හමුදා පාලන කටයුතු ද ඔවුන් දරා ඇති බව රිටිගලින් හමුවන *මහාසෙනපති* (මහාසේනාපති) තනතුර දැරීම මඟින් පැහැදිලි වේ. (*එම*: no. 251).

මුල් ඓතිහාසික සමයේදී කෘෂිකර්ම කටයුතු සම්බන්ධ ව උතුරු මැද පළාතේ පරුමකවරුන්ගේ කාර්ය භාරය තීරණාත්මක වී ඇති බව 7.4 වගුව මගින් පෙන්වා දී ඇත. විශේෂයෙන් ම පරුමකවරු එහි දී වැඩි ම දායකත්වයක් සපයා ඇත. ඔවුන් වැව් පාලකයන්, තොටුපල පාලකයන්, කෘෂි ඉඩම් පාලකයන්, කෘෂි උපකරණ භාර ව ක්‍රියාකරන්නන් ලෙස කටයුතු කොට ඇති බව ශිලා ලිපිවල සඳහන් වේ (*එම* no. 140, 260, 860, 1130, 1149, 1150, 1151, 1153, 1217, 1278).

සමාජ ස්තරගතවීම මුල් ඓතිහාසික අවධියේ දී වඩාත් ක්‍රමවත් වීම සමඟ උතුරුමැද පළාත තුළින් පරුමකවරු වෙළඳම, ශිල්ප කටයුතු, කර්මාන්ත ආදී විෂය ක්ෂේත්‍රයන්ට අවතීර්ණ වී ඇති ආකාරය මිහින්තලය, හඳගල විහාරය, බුදුගේහින්න, රිටිගල, කුරුනෑකල්ලු, තෝරවමයිලෑව, ගල්කන්දේගම, මහඇලගමුව ආදී ස්ථානවලින් හමුවන ශිලා ලිපි මඟින් පැහැදිලි වේ. ඒ අතර භාණ්ඩාගාරික කටයුතු සිදු කළ බවට හා ගණන් තබන්නා කටයුතු සිදු කළ බවට සාධක භාණ්ඩාගාරික *(බඩගරික)*, *(ගනක)*(*ibid* no. .22, 59, 63, 64 ,212) ආදී තනතුරුවලින් පැහැදිලි වේ. එසේ ම විවිධ ශිල්ප කටයුතුවලට අදාළව පරුමකවරුන්ගේ දායකත්වය ලැබී ඇති අයුරු ශිලා ලේඛන තොරතුරු මඟින් හඳුනාගත හැකිය. ඒ අතර මැණික් කර්මාන්තය *(චුඩ)*, යකඩ කර්මාන්තය *(කබර)* හා වෙළඳම ආශ්‍රිත විශේෂ ශ්‍රේණි *(පුකියන)* (*එම*.no. 44, 27, 266, 330) පිළිබඳව මිහින්තලය, හඳගල විහාර, බුදුගේහින්න, රිටිගල, කුරුණෑකල්ලු, ආදී ස්ථානවලින් හමුවන මුල් බ්‍රාහ්මී ශිලා ලිපිවලින් පැහැදිලි වේ.

උතුරුමැද පළාතේ පරුමකවරුන්ට අයත් මුල් හා අපර බ්‍රාහ්මී ශිලා ලිපිවල ස්ථානගතවීම දෙස බැලීමේ දී ඒවා බොහෝ විට පූර්ව ඓතිහාසික (මෙගලිතික) ජනාවාස හා සුසාන ආසන්නයේ බව හඳුනාගෙන තිබේ (Seneviratne 1989 : 114, Map 04). මෙම ලිපි ස්ථානගත වීමේ රටාව හා එහි පාරිසරික පදනම දෙස බැලීමේ දී ඒවා රතු දුඹුරු පාංශු කලාපයේ (red and brown earth) පිහිටා තිබේ (*එම* 114). මෙහි වඩා සිත් ගන්නා කාරණය වන්නේ පරුමක ශිලා ලිපි බොහෝමයක් උතුරුමැද පළාතේ ස්වභාවික ඛනිජ සම්පත් ගණනාවක් ආසන්නයේ ස්ථානගත වී

තිබීමය. ඒ අතර කරබන්කුලම හා මාච්චාගම ඇපටයිට් (Apatite) නිධිය ආසන්නයේ පූර්ව ඓතිහාසික අවධියට අයත් ශිලා මංජුසා සුසාන (Cist Burial) දැක ගත හැකි ය. එසේ ම මධ්‍ය යාන්ඔය අශ්‍රිත පූර්ව ඓතිහාසික ස්ථාන හා මුල් බ්‍රාහ්මී ශිලා ලිපි ස්ථානගත වන ප්‍රදේශවලට ආසන්න ව විශාල ලෙස තලාතු මිනිරන් (mica)නිධිගත වී තිබේ (එම). මෙම අවධියට අයත් මහාවංස විස්තරවල ද අනුරාධපුර නගරය වටා වූ සම්පත්වල පිහිටීම දක්වා තිබේ. පුරාවිද්‍යාත්මක සාධක හා සාහිත්‍ය මූලාශ්‍ර තොරතුරු විමර්ශනය කිරීමේ දී ද අනුරාධපුර ඊසාන දිගින්, නැගෙනහිරින් හා දකුණු දිගින් නගරය වටා සම්පත් පිහිටි බව පැහැදිලි වන අතර, එහි දී විශේෂ ප්‍රාගුණ්‍යතාවය සඳහා පරුමකරුන්ගේ දායකත්වය අනුරාධපුර නගරයේ සාර්ව භූ දර්ශනය ගොඩ නැගීමට ලැබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

අනුරාධපුර පැරණි නගරයෙන් නැගෙනහිර පර්යන්තය තුළ ස්වභාවික ඛනිජ සම්පත් ස්ථානගත ව තිබේ. ඒ අතරින් සේරුනුවර පිහිටන ස්වභාවික ලෝහ නිධිය ප්‍රධාන වේ (Seneviratne 1995 :117). මුල් ඓතිහාසික අවධියේ දී එම ලෝහ සම්පත් අත්පත් කරගැනීමේ කාර්යයේ දී පූර්ණ බලය සහිත පරුමකවරුන්ගේ කාර්ය (Powerfull parumuka families) තීරණාත්මක වී ඇති ආකාරය කුරුණෑකල්ලු පූර්ව බ්‍රාහ්මී අභිලේඛන ඇසුරෙන් හඳුනා ගත හැකිය (*Ic.Vol*i 1970 : no.319). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දෙන ආකාරයට එම ලිපියේ සඳහන් වන *පරුමක තබර* යන්න මඟින් තඹ කර්මාන්තයේ පාලනය එහි දී පරුමකවරු අතෙහි තබා ගත් බව පැහැදිලි කර ඇත (Seneviratne 1989 :115). එසේ ම ලෝහ ආශ්‍රිත කටයුතුවල පාලන බලය පරුමකවරු අත තබා ගැනීම නගුල් කෘෂිකර්මාන්තය සඳහා ඔවුන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීමක් ද විය. කෘෂිකාර්මික කටයුතුවල දී ලෝහ සම්බන්ධ ක්‍රියාවලියේ දි නගුල් කටයුතු පාලනය පරුමකවරු රඳවා ගෙන සිටි ආකාරය *පරුමක නගුලි, පරුමක නගුලිය* යන්නෙන් පැහැදිලි වේ (*Ic .vol* 1970: 260, 869). සුදර්ශන් සෙනෙවිරත්නගේ විග්‍රහයන්ට අනුව රිටිගලින් හමුවන *අරිට්ඨ මහාගාම පරුමක* සහෝදරයන් හතර දෙනෙකුගේ සම්බන්ධතාවය කෘෂිකාර්මික ක්‍රියාකාරිත්වයට සැපයීම පිළිබඳ හොඳ ම නිදසුනක් වේ (Seneviratne 1989 :115). මේ ආකාරයට ලෝහ හා කෘෂිකාර්මික කටයුතුවල පාලනය උතුරු මැද පළාත තුළ ව්‍යාප්ත කර තිබීම තුළින් පරුමකවරු පවුල්මය වශයෙන් යම්කිසි ස්ථාවරත්වයක් ස්වභාවික සම්පත් පාලනය තුළින් ලබා තිබූ බව හඳුනාගත හැකි ය.

අනුරාධපුර නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි ලෝහ සම්පත් අත්පත් කර ගැනීම ප්‍රාවාහනය හා නිමි භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධ ක්‍රියාවලිය විශේෂ ප්‍රාගුණ්‍යතාවය සහිත ව පවත්වාගෙන ගිය බව මුල් බ්‍රාහ්මී අභිලේඛන ඇසුරෙන් හඳුනාගත හැකි ය. සෙනෙවිරත්න පෙන්වා දී තිබෙන ආකාරයට ධාතුවංසයේ සඳහන් වන *මහාවාරිකා මග්ග, තම්බතිත්ථ*

(තඹ හුවමාරු තොටුපළ) සේරු නුවර සිට උතුරුමැද පළාතට හා අනුරාධපුරයට නිෂ්පාදන බෙදාහැරීම සඳහා පැවති ප්‍රධාන මාර්ග වේ (Seneviratne 1995 :130). මෙම නිෂ්පාදන බෙදා හැරීම් ක්‍රියාවලියට දායකත්වය දැක් වූ ගමිකවරු හා ගහපති කණ්ඩායම් පිළිබඳ ව අභිලේඛනවල සඳහන් වේ. ඒ අතර මුතුගල ලිපියේ *ගහපති කබර* (යකඩකරු) හා තවත් ලිපියක *ගමික තොඩික* (තොටුපල පාලක) (*Ic.Vol* i.1970:301,309) යන්නෙන් නිෂ්පාදන හා බෙදාහැරීම් පිළිබඳ ව හඳුනාගත හැකිය (Seneviratne 1995:131).

පරුමකවරු සතු ව තිබූ ලෝහ සම්පත්වල පූර්ණ පාලන බලය නිසා අනුරාධපුරය වඩා දියුණු නගරයක් දක්වා වර්ධනය වීම ඔස්සේ එහි සංස්කෘතික භූ දර්ශනයේ හැඩ ගැසීම සඳහා මුල් ඓතිහාසික යුගයේ සිදු වූ කාර්යභාරය වැදගත් වේ. එහි දී පරුමකවරුන්ගේ පාලන බලය සේරුවිල සිට අනුරාධපුරය දක්වා විහිදුණු නිෂ්පාදන බෙදාහැරීම් ජාලය ඔස්සේ හඳුනාගත හැකි අතර, ඒ ඒ ශිල්ප කටයුතුවල දී විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් ඇතිව මධ්‍ය යාන්ඔය නිම්නයේ පෙරියපුලියංකුලම, කැබිතිගොල්ලෑව, බ්‍රාහ්මණයාගම, නැට්ටුක්කන්ද, කහටගස්දිගිලිය ආදී ස්ථාන ඇසුරෙන් ක්‍රියාත්මක වී තිබේ. මුල් බ්‍රාහ්මී අභිලේඛනවල ලෝහ කර්මාන්තය ආශ්‍රිත විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් එම ප්‍රදේශවල පවත්වා ඇත්තේ පරුමක නොවන ජන කණ්ඩායම් විසිනි. පෙරියපුලියන්කුලමේ මුල් බ්‍රාහ්මී ලිපිවලින් *තබකර* (තඹකරු), *තොපග* (බෙලෙක්කරු) ආදි කර්මාන්ත පිළිබඳ ව සඳහන් වේ (*Ic.Vol.* i; 1970 : no. 350,351, 370).

පෙරියපුලියන්කුලම ප්‍රදේශයේ වාණිජ කටයුතු (වණිජ) සම්බන්ධ ක්‍රියාවලියේ නිරත පිරිස් පිළිබඳ ව සඳහන් වේ (*එම:* no. 356, 357) එමඟින් නිෂ්පාදන බෙදා හැරීම් සම්බන්ධ ක්‍රියාවලිය *මහා වාරිකා මග්ග* ඔස්සේ අනුරාධපුරය දක්වා සිදු කර ඇති බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (Seneviratne ; 1995 : 132).*මහා වාරිකා මග්ග* වශයෙන් අනුරාධපුරය දක්වා විහිදුණු නැගෙනහිර පර්යන්තයට සම්බන්ධ වූ මාර්ගය ආශ්‍රිත ව යකඩ කර්මාන්තයට සම්බන්ධ විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් දැක් වූ පිරිස් පිළිබඳ ව බ්‍රහ්මණයාගම *කබර* (යකඩකරු) (*Ic.* Vol. i ; 1970 : no.161). නැට්ටුක්කන්ද *කබරගම* (යකඩකරුවන්ගේ ග්‍රාමය) (Nicholas.Vol.ii80.no. 6). කහටගස්දිගිලිය *කබරවචි* (Uduwara,1991:211) කැබිතිගොල්ලෑව *ආචාරියාගම* (නිෂ්පාදකයින්ගේ ගම) (Seneviratne : 1995 : 132) සඳහන් වීම මගින් ලෝහ කර්මාන්තය සඳහා සුවිශේෂ වූ හැඩ ගැසීමක් මෙම ප්‍රදේශ ආශ්‍රයෙන් හඳුනාගත හැකි ය. මේ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් අනුරාධපුරය හා බද්ධ වූ ක්‍රියාවලියක් බව ක්‍රි. ව. 350 පමණ කාලයට අයත් කැබිතිගොල්ලෑව ආසන්නයේ පිහිටා ඇති ලබුඇටබැඳිගල ශිලා ලිපිය මඟින් සනාථ වේ. එම ශිලා ලිපියේ අනුරාධපුර නගරයේ නැගෙනහිර ක්‍රියාත්මක වූ වෙළඳපොළ හඳුන්වා ඇත්තේ *මහා තබක නිගම* (තඹකරුවන්ගේ වෙළඳපොළ) ලෙස ය (*Ez.Vol.* iii : 1928 : 33 ; 247 - 253). මුල් ඓතිහාසික අවධිය තුළ දමනු ලැබූ විශේෂ ප්‍රාගුණ්‍යතාවයේ උච්චත ම අවස්ථාව අපට

එමගින් හඳුනාගත හැකි අතර සුවිශේෂීකරණය වූ ලෝහ වෙළඳපොළක් අනුරාධපුර සංස්කෘතික භූදර්ශනයට එකතු වී තිබූ බව ඉන් පැහැදිලි වේ. එම සුවිශේෂීකරණය වූ වෙළඳපොළෙහි උපයෝගීතාවය ඇතුළුපුරයේ සිදු කරනු ලැබූ කැණීම් මගින් ද තහවුරු වී තිබේ. AG 69 ගෙඩිගේ කැණීමේ 4B පස් තට්ටුවෙන් තද නිල් පැහැති පාරදෘශ්‍ය වීදුරු පබළු ලැබී තිබේ. (Dark Blue transparent Beads) ඒවා නිෂ්පාදනය සඳහා කොබෝල්ට් (Cobalt) නැමති ඛනිජ වර්ගය අවශ්‍ය වේ. සිරාන් දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට කොබෝල්ට් බහුල වශයෙන් සේරුවිල තඹවල අඩංගු වේ (Deraniyagala 1986 : 44). වීදුරු ආලේප උළු (Glazed tiles) නිෂ්පාදනයට අවශ්‍ය කොපර් ඔක්සයිඩ (Cooper Oxide) ලබා ගැනීමට ද සේරුවිල තඹ වැදගත් වී ඇත (එම:42). අනුරාධපුර නැගෙනහිර ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ වෙළඳපොළ සඳහා වඩා සුවිශේෂ ආකාරයට තඹ නිෂ්පාදනය සඳහා ඉඩකඩ ලබාදීම මඟින් නැගෙනහිර පර්යන්තය හා කේන්ද්‍රීය ප්‍රදේශය ආශ්‍රිත ගනුදෙනුව වඩා සාර්ථක භූ දර්ශනයක් ගොඩ නැඟීමට බලපා ඇති බව එම තොරතුරු අනුවද පෙනේ. මේ තත්ත්වයේ වර්ධනය අපට හඳුනාගත හැක්කේ මධ්‍ය ඓතිහාසික අවධියේ මුල් කාල පරිච්ඡේද තුළිණි.

මේ ආකාරයට මුල් ඓතිහාසික අවධියේ අනුරාධපුර භූදර්ශනය ගොඩ නැඟීම සඳහා එවකට පැවති සමාජ සැකැස්ම වැදගත් වී තිබෙන අතර එම සමාජ සැකැස්ම තුළ පරුමකවරුන්ගේ කාර්යභාරය වශයෙන් සම්පත් අත්පත් කර ගැනීම හා පාලනය කිරීම ඔස්සේ ඔවුන් ලබාගෙන තිබූ සමාජ දේශපාලන (Socio - Political) තත්ත්වය අනුරාධපුර පුළුල් භූ දර්ශනය ගොඩනැඟීමට සුවිශේෂ වී ඇති අන්දම සමාජ පුරාවිද්‍යාත්මක වශයෙන් හඳුනාගත හැකි ය. මේ තත්ත්වය මත අනුරාධපුරය වඩා පුළුල් ආකාරයට නැගෙනහිර ප්‍රදේශයේ පැවති ලෝහ සම්පත් අත්පත් කරගෙන එහි තීරණාත්මක බලය පාලනය කිරීම මුල් ඓතිහාසික අවධිය තුළ කැපී පෙනෙන අතර එම තත්ත්වය ඇතුළුපුරයේ පමණක් නොව ජේතවනය හා වෙස්සගිරිය තුළින් ද හඳුනාගත හැකි ය.

ජේතවන විහාර භූමිය ආශ්‍රිත ප්‍රාග් ජේතවන ස්තර ඇසුරින් බහුල වශයෙන් ම තඹ බොර මෙන් ම යකඩ බොර ද ලෝහ උණු කිරීමට භාවිත කරනු ලැබූ කෝව හා උදුන් ද හඳුනාගෙන තිබේ (මැන්දිස් : 2009 20 - 22). එසේ ම වෙස්සගිරිය ආශ්‍රයෙන් ද ලෝහ බොර, කෝව කොටස් මුල් ඓතිහාසික අවධියට අයත් පස් ස්තරවල තිබී හමු වී ඇත (Mendis 2007 : 16 - 18).මෙය තවදුරටත් තහවුරු කළ හැකි සාධක අතර වෙස්සගිරියේ මුල් බ්‍රාහ්මී ලිපියක් අනුව ද පැහැදිලි වේ. එහි එක් ලිපියක රන් කර්මාන්තය හා සම්බන්ධ පුද්ගලයෙකු *තලදර* යනුවෙන් දක්වා තිබේ (*Ic.Vol.*i. 1970 : no. 80).*තලදර* යන්න පිළිබඳ ව විග්‍රහයක යෙදෙන පරණවිතාන එය සංස්කෘත *තුලාධර* හා සිංහල *තරහල්* යන්නට පරිවර්තනය කිරීමෙන් එමඟින් රන් ආශ්‍රිත ශිල්ප කටයුත්තක නියුක්ත වූවකු ගම්‍ය වන බව පෙන්වා දී ඇත.

(එම: xcvil) එසේ *මතලද්දර* යනු රන්කාසි හුවමාරු කළ හෝ රන් කිරුම් මිණුම් කළ පුද්ගලයෙකු වියහැකි බව සෙනෙවිරත්නගේ මතයයි. (සුදර්ශන් සෙනෙවිරත්න සමඟ සිදුකල සම්මුඛ සාකච්ඡාවක් ඇසුරෙනි.) තලදර යන්නෙන් රන් ආශ්‍රිත ශිල්ප කටයුතු පිළිබිඹු වන බව තහවුරු කළ හැකි තවත් ලිපි කිහිපයක් තිබේ. ඒ අතර මණ්ඩාගලින් ලැබුණු ලිපියක ද *තුලාධර* යන්න ගැන සඳහන් වේ (එම : No. 593)එමගින් කිරුම් මිනුම් උපකරණ දරන්නා යන්න අර්ථවත් වන බව පරණවිතාන පෙන්වා දී ඇත. එසේ ම කෝන්ගල ලිපියක සඳහන් *තලදර පුත* යන්න විමර්ශනය කරන ඔහු එයින් 'රන්කරුවාගේ පුතා' යන්න ගම්‍ය වන බව ඔහු පෙන්වා දී ඇත. එම නිසා වෙස්සගිරියේ හමුවන *තලදර* නැමැත්තා රන් කර්මාන්තය ආශ්‍රිත කටයුතු කළ පුද්ගලයකු හෝ රන්කාසි හුවමාරු කළ හෝ රන් කිරුම් මිණුම් කළ පුද්ගලයෙකු විය හැකි බව මෙම අර්ථ නිරූපණය අනුව පෙන්වා දිය හැකි ය.

මෙම පුරාවිද්‍යාත්මක කරුණු සැලකිල්ලට ගැනීමේ දී අනුරාධපුර ඇතුළුපුරයෙන් නැගෙනහිර පර්යන්තය තුළ පිහිටි ස්වභාවික සම්පත් මුල් ඓතිහාසික අවධියේ දී පරිහරණය සම්බන්ධයෙන් එහි වැඩිම උපයෝගීතාවය අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශ තුළින් සිදුවී ඇති බව පෙනේ. එහි දී විශේෂයෙන් ම සේරුවිල සිට අනුරාධපුරය දක්වා තඹකරුවන්, යකඩකරුවන්, බෙලෙක්කරුවන් හා රන්කරුවන් ආශ්‍රිත සුවිශේෂ ශිල්පීය හා වාණිජ ක්‍රියාවලිය සිදු වූ නිසා අනුරාධපුර සාර්ව සංස්කෘතික භූ දර්ශනය ගොඩ නැඟීම සඳහා එම සම්පත්වල උපයෝගීතාවය වැදගත් වූ අන්දම අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් කරුණු අනුව පෙන්වා දිය හැකි ය. (සේරුවිල සිට අනුරාධපුරය දක්වා විහිදුණු ලෝහ නිෂ්පාදන ක්‍රියාවලිය 7.5 රූප සටහන් මඟින් පෙන්වා දී ඇත.)

## *පරුමක ජන කණ්ඩායම හා සබඳ වූ ජන කණ්ඩායම් ඇසුරින් අනුරාධපුර සාර්ව සංස්කෘතික භූ දර්ශනය ගොඩනැංවීම*

අනුරාධපුරයෙන් නැගෙනහිරට මෙන්ම දකුණු දෙසට පරුමකවරුන්ගේ ස්ථානගත වීම සම්බන්ධව විමර්ශනය කරන විට ක්‍රමානුකූල ව කඳුකර කලාප දක්වා ව්‍යාප්ත වීමේ ස්වරූපය හඳුනාගත හැකිය. අනුරාධපුර නගරයට දකුණුදිග ප්‍රදේශයේ වූ සම්පත් අත්පත් කරගෙන පරිහරණය සම්බන්ධව තොරතුරු ඉහළ කලාඔය තැනිතලා අසල පිහිටි කුඩා කඳු ප්‍රදේශ තුළින් හඳුනාගත හැකි ය. එම ප්‍රදේශ නතුකරගෙන සිටි පෙළපත් කණ්ඩායමක් පරම්පරා කිහිපයකට පසු මධ්‍ය කඳුකරයේ සම්පත් අඩංගු ප්‍රදේශ දක්වා සිය ආධිපත්‍යය ව්‍යාප්ත කර ඇති බව සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (Seneviratne 1996- 295). ඔවුන් පොදුනි රාජ පරපුර වශයෙන් හැඳිනගතහැකි වුව ද පොව් රාජ පරපුර පරුමක කණ්ඩායමකින් සම්භවය ලැබූවන් වීමට බොහෝ ඉඩකඩ පවතින බව ඔහු

පෙන්වා දී ඇත (*එම*, 1996 : 295).මෙම කණ්ඩායම නිෂ්පාදන බෙදාහැරීම් කෙරේ. කිසියම් පාලනයක් අදාළ ප්‍රදේශ ඇසුරෙන් සිදු කරන්නට ඇති බව පෙන්වා දෙන සෙනෙවිරත්න (*එම*) ඒ ඔස්සේ නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථාන පෙළපත් කණ්ඩායම් විසින් පාලනය කරන්නට ඇතැයි ද පෙන්වා දෙයි. එය එසේ නම් කඳුකර ප්‍රදේශයේ සිට පහළට විහිදෙන්නා වූ ප්‍රදේශ ආශ්‍රයෙන් හමුවන *චූඩ* (මැණික්) කර්මාන්තය හෝ ඒ ආශ්‍රිත ඛනිජ සම්පත් භාවිත කිරීමේ පුරෝගාමීන් ලෙස පරුමකවරුන් කටයුතු කර ඇති බව ද මැනවින් පැහැදිලි වන. අතර එම කටයුතු ඔවුන් විසින් ඒකාබද්ධ මණ්ඩල හෝ ශ්‍රේණි වශයෙන් සිදුකරන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. පරුමකවරු වෙළඳ කුල වශයෙන් සේවය කළ බව කුරුණෑකල්ලු පූර්ව බ්‍රාහ්මී ශිලා ලිපියේ *පරුමක පුකියන* යන්නෙන් පැහැදිලි වේ (*Ic. Vol.* i : 1970 : no. 319). එවැනි වෙළඳ ශ්‍රේණි හෝ කුල විසින් කඳුකර ආශ්‍රිත ප්‍රදේශවල සම්භවය ලබන ඛනිජ සම්පත් රට මැද පිහිටි අනුරාධපුරය දක්වා රැගෙන ඒමේ දී අර්ධ නිමි ද්‍රව්‍ය වශයෙන් රැගෙන එන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට මෙවැනි ද්‍රව්‍ය ප්‍රවාහනයේ දී අතරමැදි වාපිගාම ජනපදවල පිහිටි නිෂ්පාදන බෙදා හැරීම් මධ්‍යස්ථාන ඔස්සේ බෙදාහැර තිබේ (Seneviratne 1996 : 300). (බලන්න රූප සටහන් අංක 6.5)

දක්ෂිණ පර්යන්තයේ එවැනි මධ්‍යස්ථාන ක්‍රියාත්මක වීමේ දී පරුමකවරුන්ගේ කාර්යභාරය තීරණාත්මක වී ඇති බව සීගිරියේ පමණක් පරුමක පුද්ගලයින් 34 දෙනෙකුට අයත් මුල් බ්‍රාහ්මී අභිලේඛන හමුවීමෙන් පහැදිලි වේ (*එම*) පොදු රටාවට අනුව මේ ප්‍රදේශයේ පරුමකයින් ඉතා ම ධනවත් සමාජ, ආර්ථික කණ්ඩායමක් වූ අතර ඒ නිසා ම එම ප්‍රදේශවල ශ්‍රම, ජනාවාස ඒකක, තොටුපල පාලනය, කෘෂිකාර්මික නිෂ්පාදන හා ඛනිජ සම්පත් කෙරේ බලපෑම් සිදු කොට ඇති ආකාරය පරුමක *බුජික, පරුමක නගුලි, පරුමක තොට බොජක, පරුමක නගරගුත, පරුමක වපිගමික, පරුමක චූඩ, පරුමක ගණිත* යන තනතුරු අනුව පෙනේ (*Ic. Vol.* i. 1970: no. 869, 860, 1219, 217, 203).

පරුමක කණ්ඩායම සමාජ, දේශපාලන හා ආර්ථික වශයෙන් ඉස්මතු වීම සමඟ ඔවුන් වෙනත් ජන කණ්ඩායම් සමඟ විවාහ සම්බන්ධතා හා ඥාති සම්බන්ධතා පවත්වා තිබේ. ඒ අතර *ගහපති, ගමික, අෂ අය* ආදී ජන කණ්ඩායම් ප්‍රධාන වන අතර එවැනි සම්බන්ධතා මහඇලගමුවෙන් වාර්තා වේ. ගහපති පදවිය දැරූවකු *ගහපති චූඩ* වශයෙන් හැඳින්වීමත් කන්දේගම කන්ද ලිපියක *ගහපති චූඩික* වශයෙන් ද, මුතුගල මුල් බ්‍රාහ්මී අභිලේඛනයක *ගහපති කබර* වශයෙන් ද ඥාති සම්බන්ධතා ඇති කර ගැනීම තුළින් කැපී පෙනේ (*එම*, no. 215,297, 301). ගහපතිවරුන් මෙන් ම ගමිකවරු ද පරුමක පදවිය දැරූවන් සිදුකළ කාර්යයන්ට සම්බන්ධ වී කටයුතු කර ඇති ආකාරය මිහින්තලය හා මුතුගලින් හඳුනාගත හැකිය. එම කාර්යයන්


අතර *ගමික බඩගරික* හා *ගමික තොඩික* ලෙස, භාණ්ඩාගාරික හා තොටුපල පාලනය සම්බන්ධ කටයුතුවලට ඔවුන් සම්බන්ධ වී ඇත (*එම*, no. 39, 309).

මේ ආකාරයට සමාජ සබඳතා ඔස්සේ ඇතිවන්නා වූ සම්පත් අත්පත් කර ගැනීම්, බෙදා හැරීම් කඳුකර කලාපය හා පහළ තැනිතලා අතර සිදු වූ ක්‍රියාවලිය ඉන් පසු නිෂ්පාදන බෙදා හැරීම් මධ්‍යස්ථාන හරහා ප්‍රධාන නගරය වූ අනුරාධපුරය දක්වා ඇදී ඒම හඳුනාගත හැකිය. 1980 දශකයේ අනුරාධපුර ඇතුළු පුරයේ ජනාවාස ආශ්‍රිත ව සිදු කරන ලද කැණීම්වල දී ක්‍රි. පූ. යුගයේ ජනාවාස ස්තරවලින් එයට පෙර පැවති යුගයට වඩා පුළුල් තේරීමක් ඇති මැණික් ගල් වර්ග ද, මැණික් කර්මාන්ත ආශ්‍රිත ශේෂ ද රත්තුං හා තඹ වැනි ඛනිජ වර්ග ද සාපේක්ෂ ලෙස බහුල වශයෙන් හමුවන බව හඳුනාගෙන ඇත (සෙනෙවිරත්න 1996 : 190). එම තොරතුරු අනුව මුල් ඓතිහාසික අවධිය තුළ දී ඛනිජ සම්පත් ඇතුළු ස්වභාවික සම්පත් කඳුකර කලාපයෙන් සෘජුව ලබා ගැනීමේ ප්‍රවණතාවය හඳුනාගත හැකි ය (*එම*).

කඳුකර කලාපයේ සම්භවය ලබන ඛනිජ ද්‍රව්‍ය නිෂ්කරණය, නිෂ්පාදනය හා ඒවා වියළි තැනිතලා භූමිය දක්වා ප්‍රවාහනය කිරීම දඹුල්ලේ සිට නුවර සානුව දක්වා විහිදෙන්නා වූ මාර්ගයේ ස්ථානගත ව ඇති පූර්ව බ්‍රාහ්මී ශිලා ලිපි තුළින් හඳුනාගත හැකිය. එම නිෂ්පාදන මධ්‍යස්ථාන, හුවමාරු මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු අවුකන, කලා වැව, කන්දලම, දඹුල්ල ප්‍රදේශ ආශ්‍රයෙන් ඇති මුල් බ්‍රාහ්මී අභිලේඛන තුළින් පුළුල් නිෂ්පාදන මධ්‍යස්ථාන හා බෙදා හැරීමේ සංකීර්ණයන් පැවති බවට කදිම සාක්ෂි සපයා දෙයි (*එම*). මෙසේ ඇති වූ අන්තර් සම්බන්ධතාවන්හි අභ්‍යන්තර ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මුල් බ්‍රාහ්මී ශිලා ලිපි හා වංශ කතා ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රය තුළ මෙම ප්‍රදේශ ඇසුරින් ක්‍රියාත්මක වූ නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථාන *කටක, කඩ, කඩක, කණ්ඩ* වැනි පද වලින් හඳුන්වා ඇත. ඒ පිළිබඳව විග්‍රහයක යෙදෙන සුදර්ශන් සෙනෙවිරත්න මහාවංසයේ පණ්ඩුකාභයගේ සංග්‍රාම ආශ්‍රිත ව *ගිරිකණ්ඩ*, වට්ටගාමිණීගේ ගමන් මාර්ග ආශ්‍රිත ව *සිලාසොබ්බකටක*, දඹුල්ල හා බුදුගේහින්න ආශ්‍රිත බ්‍රාහ්මී ලිපිවල සඳහන් *උපරිකඩ* හා *මතුකඩ* යන වචනවල එන කඩ, කටක වචනවලින් සීමාව, ප්‍රවිෂ්ටය, සුළු වෙළඳපොල අර්ථවත් වන බව පෙන්වා දෙයි (*එම*: 192). බුදුගේහින්න හා දඹුල්ල ශිලා ලිපිවල සඳහන් වන *උපරිකඩ*හා *මතුකඩ* යන වචනවලින් *උපරිකඩ* යන්නෙන් ඉහළින් පිහිටි වෙළඳපොල හෝ කඩඉම අර්ථවත් වන බව ඔහු පෙන්වා දී තිබේ (*එම*: 193). ඒ අනුව උපරිකඩ පහළ කඳුකර කලාපයේ පිහිටි භාණ්ඩ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගත හැකි බව සෙනෙවිරත්නගේ මතයයි. මෙම ජනාවාසය කඳුකර කලාපයෙන් ඛනිජ සම්පත් ලබා ගත් ස්ථානයක් වීමට ඉඩ ඇතැයි ඔහු විශ්වාස කරනු ලැබේ (*එම*).

පහත් කඳුකර කලාපය හා අනුරාධපුර පුරාණ නගරය ආශ්‍රිත ඛනිජ සම්පත් හුවමාරුව පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී මහනුවර තාලන්ද හා තදාශ්‍රිත ප්‍රදේශයේ හමුවන ඛනිජ සම්පත් පරිහරණය සම්බන්ධ මුල් ඓතිහාසික අවධියේ කාර්යභාරය තීරණාත්මක වී තිබේ. විශේෂයෙන් ම වේගිරි දේවාලය, ගෝනවත්ත, බඹරගල යන ස්ථානවලින් *මණිකර, මහාවුඩික,පොවුනිරජ* යන පදවි පිළිබඳ ව සඳහන් වේ (*Ic Vol*. i. 1970 : no. 807,813,814). මෙම ලිපිවල සඳහන් *මහාවුඩ* යන්නෙන් *මහාමැණික භාරකරුවායන්න* ගම්‍ය වන බවත්, ඒ අනුව මහාවුඩ රජුගේ *මණිකරුවන්*(මැණික්කරුවන්) පාෂාණ කුට්ටි ලබා ගැනීම සඳහා මෙම ස්ථානයට පැමිණ තිබේ (සෙනෙවිරත්න 1996 : 193). ඔහු ප්‍රකාශ කරන ආකාරයට මෙම පාෂාණ කැබලි මැණික් ගල් හෝ තලාතු මිනිරන් විය හැකි ය. එය එසේ උපකල්පනය කළ හැක්කේ ක්‍රි. ව. වර්ෂ 1 වන සියවසේ තම්බපණ්ණියෙන් කැස්බෑ ලෙලිවන් පාෂාණ වර්ගයක් නිර්යාත කළ බව ප්ලිනි වාර්තා කර තිබෙන බැවිනි. කැස්බෑ ලෙලිවන් පාෂාණය වශයෙන් ප්ලිනි හඳුන්වන්නේ තලාතු මිනිරන් බව සෙනෙවිරත්නගේ මතය වේ (සෙනෙවිරත්න 1996 : 193).

මුල් ඓතිහාසික අවධිය වනවිට අනුරාධපුර ඇතුළුපුර ජනාවාසයේ වාණිජ කටයුතු සම්බන්ධ ව උපයෝගීතාවය බහුල වී තිබූ බව දැරණියගල හා කනිංහැම් ද පෙන්වා දී ඇත. දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට මධ්‍ය පූර්ව ඓතිහාසික අවධිය (Mid - Early Historic) තුළ දෙස් විදෙස් ඛනිජ පාෂාණ බහුල ව භාවිතා වී තිබේ (Deraniyagala 1992 : 712). **AG 69**ගෙඩිගේ කැණීම තුළින් දේශීය ඛනිජ පාෂාණ වන ඇමතෙස්ත, තිරුවානා, හා රබහ, ආදී ඛනිජ පාෂාණ වලින් නිර්මිත පබළු හඳුනාගෙන ඇත (*එම* 1972 : 134 - 135).කනිංහැම් දක්වා ඇති අදහස්වලට අනුව ද දෙස් විදෙස් වෙළඳාම සම්බන්ධ ද්‍රව්‍යමය සාධක රැසක් $ASW_2$ කැණීමෙන් අනාවරණය වී තිබේ (Coningham 1999 : 127 - 128).ගොඩනැගිලි අවධි H (Structural Period H) තුළින් හමුවන ද්‍රව්‍යමය සාධක අතර ක්‍රිස්තු වර්ෂ පළමු ශත වර්ෂයට අයත් අක්ෂරයෙන් පෙළ සටහන් වූ පරුමකවරයෙකුට අයත් මැටි මුද්‍රාවක් හමු වී තිබේ. එම මැටි මුද්‍රාව තුළ අන්තර්ගත පාඨය ලෙස *තිසපුත පරුමක* යන්න සඳහන් වේ (*එම*)කනිංහැම් පෙන්වා දී ඇති ආකාරයට මෙම නාමයට සමාන නමක් මිහින්තලයේ ගුහා ප්‍රදානයක් තුළින් ද හඳුනාගත. හැකිය (*එම*).පරණවිතාන විසින් මෙම ලිපිය වාර්තා කොට තිබෙන (*IC. Vol*. i. 1970 : no. 22) අතර එම ලිපිය අයත් වී ඇත්තේ *(බඩගරික පරුමක)* භාණ්ඩාගාරික පරුමකවරයෙකුට බව පැහැදිලි වේ (*එම*).




IV - Iron Village
KD - Kahatagasdigiliya
KG - Kebithigollewa
MCM - Maha Charica Magha
SW - Seruwila
PT - Parumaka tabura
MYO - Middle Yan Oya Basin
PP - Periya Puliyankulama
TS - Tin – Smith
JPS - Jetavana Production Site
APC - Anuradhapura Citadel

IS - Iron - Smith
AG - Achariyagama
EMK - Eastern Market
NMK - Nothern Merket
SMK - Sourthern Market
WMK - Westerm Market
MT - Mantota
CS - Copper Smith

*රූප සටහන් අංක 01*

*මුල් ඓතිහාසික අවධියේ සේරුවිල සිට අනුරාධපුරය දක්වා ලෝහ සම්පත් බෙදා හැරීමේ ස්වරූපය දැක්වෙන රූප සටහන*

එසේ නම් ඇතුළු පුරයෙන් හමුවන පරුමක මුද්‍රාව මිහින්තලය අවට ක්‍රියාත්මක වූ වාණිජ කටයුතුවලට අදාළ ශ්‍රේණියකට සම්බන්ධ වීමට ඉඩ ඇති බව උපකල්පනය කළ හැකි අතර ක්‍රි. පූ. 2-1 සියවස්වල දී උතුරු ප්‍රදේශයෙන් ද මෙවැනි ආකාර මැටි හා ලෝහ මුද්‍රා වානිජ කටයුතුවලට අදාළ ව හමු වී තිබෙන බව සුදර්ශන් සෙනෙවිරත්න ප්‍රකාශ කරන ලදී (සෙනෙවිරත්න සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි).

මේ අනුව මුල් ඓතිහාසික සමය තුළ දී ඇතුළු පුරය තුළින් කඳුකරයේ ප්‍රභවය ලැබූ මැණික් ගල් වර්ග සුලභ ලෙස වාර්තා වීම තුළින් පැහැදිලි වන්නේ මෙම භුවමාරු යාන්ත්‍රනය පහත් තැනිතලා කලාපවල සිට අනුරාධපුය දක්වා සිදු කර ඇති බව ය. ක්‍රි. පූ. 3 වන සියවසින් පසු දුට්ඨගාමිණී රාජ යුගය සම්බන්ධ මහාවංස විස්තරවල ද නගරයේ දකුණු පසින් පිහිටන ස්වභාවික සම්පත් පිළිබඳ විස්තර දක්වා තිබීමත් එය පැහැදිලි වේ. අනුරාධපුරය ඍජු ආකාරයට කඳුකර හා පහත් කඳුකර කලාපවල තිබූ ඛනිජ හා ඛනිජ පාෂාණ ලබා ගැනීමට උත්සුක වී ඇති බව ඉහළ කලා ඔය පද්ධතිය අළලා සිදුකර ඇති සමාජ පුරාවිද්‍යාත්මක අධ්‍යයන තුළ දී හඳුනාගන ඇත (සෙනෙවිරත්න 1996:194). දඹුල්ලේ සිට මහනුවර සානුව දක්වා දිව ගිය පුරාණ මාර්ගය ආශ්‍රිත අධ්‍යයනයක් සිදු කොට ඇති සෙනෙවිරත්න එම මාර්ගය ඔස්සේ ස්ථානගත ව ඇති ශිලා ලිපිවල පුද්ගලික නාමයන් වශයෙන් *චුඩ, චූඩි* යනුවෙන් සඳහන් වන බවත් (*එම*) මෙම පදවලින් මැණික් කර්මාන්තය ආශ්‍රිත කටයුතු හඳුනාගත හැකි බැවින් ගහපති පිරිස් මෙම නාමය ගැනීම තුළින් මැණික් හෝ වටිනා ඛනිජ පාෂාණයක් ආශ්‍රිත වාණිජ කටයුතු සංකේතවත් කරන බව ඔහුගේ මතය වේ (*එම*). ඒ සඳහා උදාහරණ රුසිගම පිහිටි ගහපතිවරයෙකුගේ නාමය *චූඩධර* ලෙසත් (*Ic. Vol.* i. 1970 : no. 828), මහඇලගමුවේ ශිලා ලිපියක *චූඩ* ලෙස ත් ඛනිජ පාෂාණ ආශ්‍රිත ක්‍රියාවලියේ නිරත වූ පුද්ගලයින් ගැන හඳුන්වා තිබේ (සෙනෙවිරත්න 1996 : 194).

ඉහතින් විස්තර කරනු ලැබූ මාර්ගය ආශ්‍රිත සමාජ පුරාවිද්‍යාව කඳුකර ප්‍රදේශයේ එකල පැවති සමාජ ආර්ථික ව්‍යුහය පිළිබඳ ව ඉඟි අප වෙත ලබා දේ. විශේෂයෙන් ම ඛනිජ හා ඒ ආශ්‍රිත කටයුතුවල දී මෙම මාර්ගය ඔස්සේ පිහිටා තිබූ ජනාවාස පමණක් නොව නිෂ්පාදන මධ්‍යස්ථාන පිළිබඳ ව ද සාක්ෂි බඹරගල ශිලා ලිපියේ *චිත නගර* කුඩාගල ශිලා ලිපියේ *පුග* (ශ්‍රේණිය) බඹරගල හා ඇඹුල්අඹේ *පොචි රාජ පරම්පරාව (පොචනික)* (*Ic. Vol.* i. 1970: no. 841, 830,831, 832, 833) පිළිබඳ ව සඳහන් වීමෙන් මෙම කණ්ඩායම මහනුවර සානුව දක්වා ම ඛනිජ සම්පත් හසුරුවා ඇති බව පැහැදිලි වී ඇත (සෙනෙවිරත්න 1996 : 195).

ක්‍රි. පූ. 1 වන සියවස පමණ සිට මෙම ප්‍රභූ පිරිස් හුවමාරු මධ්‍යස්ථාන වඩා පුළුල් ආකාරයට හසුරුවමින් අන්තර් වාණිජ ප්‍රදේශ ඔස්සේ නිෂ්පාදන සහ වාණිජ සංකීර්ණ වෙතට ලෝහ වර්ග හා මැණික් ගල් ආදිය පරිවහනය කොට ඇත (*එම*). දඹුල්ලේ සිට උතුරට දිවෙන මාර්ගය අනුරාධපුරය ඔස්සේ *මහාතීර්ථයටත්*, උතුරු දිගින් *ජම්බුකෝලපට්ටනයටත්* ද්‍රව්‍ය පරිවහනය කරන ලද මාර්ගය ලෙස සෙනෙවිරත්න හඳුනාගෙන ඇත (*එම*). ඒ අනුව මුල් ඓතිහාසික අවධියේ කඳුකර කලාපය ආශ්‍රිත ව ජීවත් වූ ජන පිරිස් අනුරාධපුරය වෙත ආයාත කළ ඛනිජ ද්‍රව්‍ය එක්රැස් වූ ස්ථානය නගරය ආසන්නයේ ක්‍රියාත්මක වෙළඳපොළ (නිගම) තුළට පැමිණිය යුතු ය. එවැනි නිගමන පිළිබඳ සාධක වෙස්සගිරියේ B පර්වත මස්තකයේ පිහිටි ක්‍රිස්තු වර්ෂ 2 වන සියවසට අයත් ශිලා ලිපිය අනුව හඳුනාගත හැකිය.

අනුරාධපුර නගරයේ නැගෙනහිරින් හා උතුරින් පිහිටන වෙළඳපොලවල් පිළිබඳ සාධක ලබුඇටබැඳිගල හා තෝනිගල ආදී ශිලා ලිපිවල ද සඳහන් වේ. වෙස්සගිරියේ ඇති ලිපියේ සඳහන් වන *මුජිතගම නකරක නිගම* අනුරාධපුරයේ නගරයට දකුණින් ස්ථානගත ව තිබූ වෙළඳපොල වීමට ඉඩ පවතින බව උපකල්පනය කළ හැකි අතර අනුරාධපුරයට දකුණු ප්‍රදේශයෙන් පැමිණි ඛනිජ සම්පත් ඇතුළු සෙසු සම්පත් මෙවැනි නිගමස්ථානයක් (වෙළඳපොලක්) තුළ හුවමරු වන්නට ඇත. එය නගරයේ දකුණු ප්‍රදේශයේ මුල් ඓතිහාසික අවධියේ භූ දර්ශනය ගොඩ නැගීමේ දී බෙහෙවින් ම වැදගත් වන්නට ඇත. මේ අනුව අනුරාධපුර සාර්ව භූ දර්ශනයේ අවකාශය ගොඩ නැගීමේ දී ඛනිජ සම්පත් කළමනාකරණය තුළ දී සම්පත් අත්පත් කර ගැනීම, නිෂ්පාදනය හා බෙදා හැරීම සම්බන්ධ යාන්ත්‍රනයට අදාළ ක්‍රියාදාමය ඉහළ කලා ඔය පද්ධතියේ සිට අනුරාධපුරය දක්වා සිදු වී ඇති ආකාරය නිසා ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරයේ ඉස්මතුවීම හඳුනාගත හැකිය.

ඉහතින් විස්තර කර ඇති සම්පත් හුවමාරු ජාලය ඉහළ කලා ඔය පද්ධතියේ සිට පහළට අනුරාධපුරය දක්වා පැමිණීමේ දී අන්තර් හුවමාරු මධ්‍යස්ථාන කඩ හා වැව් ගම් (වාපිගාම) නගර ඔස්සේ මහා නගරයට පැමිණ ඇති බව රණගිරිමඩ, දඹුල්ල, අවුකන, තෝනිගල යන ස්ථාන ඇසුරින් හඳුනාගත හැකිය. එම් ස්ථානවල ඇති මුල් ඓතිහාසික අවධියේ ශිලා ලිපිවල *අබනගර* (Ic. Vol. i. 1970 : no. 959, 962) *මතුගම* (*එම*: no. 837) *කඩපිවපි* (*එම*: no. 1151) *රකිතගම* (*එම* : no. 840) *උපරිකඩ* (*එම* : no. 841)*අක නගර හා පඩගම* (*එම* : no. 1051 - 1052)යන ස්ථාන ඇසුරින් එවැනි මධ්‍යස්ථාන ක්‍රියාත්මක වී තිබේ. මනතුංග පෙන්වා දෙන ආකාරයට පූර්ව නාගරික මට්ටමේ සිට උපරිම නාගරික අවධිය වන විට අනුරාධපුර නගරයට පර්යන්ත ප්‍රදේශවල *නකනගර*, *ලබුනගර*, *ලෙහෙක නගර* ආදී

වශයෙන් උප නගර බිහි ව තිබූ බව පෙන්වා දී තිබේ (Manatunga 1987 : Fig. 01).

මේ ආකාරයට ග්‍රාම නගර හා මහ නගර යන සංකල්පය තුළ මහනගරයක් ලෙස අනුරාධපුරය ඉස්මතු වීම උදෙසා බහුවිධ සම්පත් හුවමාරු යාන්ත්‍රනයේ දී වාණිජ කටයුතු ආශ්‍රිතව ක්‍රියාත්මක වූ ශ්‍රේණි වැදගත් වී ඇත. මුල් ඓතිහාසික අවධියට අයත් මුල් බ්‍රාහ්මී අභිලේඛන තුළින් එවැනි ශ්‍රේණි හා වාණිජ කටයුතු පිළිබඳ ව තොරතුරු ශ්‍රී ලංකාව ඇසුරින් හඳුනාගත හැකි බව පරණවිතාන පෙන්වා දී තිබේ (*Ic.* Vol. i.:xcviii - xcix). ඔහු විස්තර කර ඇති ආකාරයට එම කාල වකවානුව තුළ වාණිජ කටයුතුවල නියැලුණු ජන පිරිස් *වනිජ, පුග, පුක, පුකිය, පුකියන* ආදී නාමයන්ගෙන් හඳුන්වා තිබේ (*එම*). ආකාරයේ වාණිජ කටයුතු පිළිබඳ ව සඳහන් වේ.


පුලියන්කුලමේ මුල් බ්‍රාහ්මී අභිලේඛනවල *දමෙඩ වනිජවරුන්* පිළිබඳ ව සඳහන් වේ (*එම* : no. 356, 357). පරණවිතාන පෙන්වා දෙන ආකාරයට මොවුන් දමිළ වෙළෙන්දන් වේ (*එම* : xcviii). මුල් ඓතිහාසික අවධියේ උතුරුමැද පලාත තුළ වාණිජ කටයුතුවල නියැලි කණ්ඩායම් අතර වෙළඳකුල හා සමාගම් වශයෙන් කටයුතු කළ පිරිස් ද හඳුනාගත හැක. ඒ අතර මහාකපුගොල්ලෑව මුල් බ්‍රාහ්මී ශිලා ලිපියේ එන *පුගියන* (*එම* : no. 135), අලියකඩ ලිපියේ*පුගියන* (*එම* : 138) යන නම්වලින් වෙළඳ සමාගම් (Corporation) හැඳින්වෙන බව පරණවිතාන අර්ථ නිරූපණය කර ඇත (*එම*:xcix).ශ්‍රේණි පිළිබඳ විග්‍රහ කරන මහින්ද කරුණානායක එමගින් යම් ප්‍රදේශයක මිනිසුන්ගේ අවශ්‍යතා සඳහා සැකසුන ප්‍රාදේශීය සංස්ථාවක් ශ්‍රේණි වශයෙන් නිර්මාණය වූ බව පෙන්වා දී ඇත (කරුණානායක 1967:63-76)

එසේ ම *ගන* වශයෙන් මුල් බ්‍රාහ්මී ලිපිවල හැඳින්වෙන කණ්ඩායම් ද වෙළඳ සමාගම් විය හැකි බව වෙස්සගිරියේ ඇති ශිලා ලිපියකින් හඳුනාගත හැකිය (*Ic. Vol.* i.: No. 86). ශ්‍රී ලංකාවේ මුල් බ්‍රාහ්මී අභිලේඛනවල වාණිජ කටයුතුවල නියැලි ජන පිරිස අතර බරතවරුන් ද කැපී පෙනෙන ජන කණ්ඩයමකි (සෙනෙවිරත්න, 1987 : 73). මුල් ඓතිහාසික අවධියට අයත් බරත ශිලා ලිපි 07ක් උතුරුමැද පලාත ඇසුරෙන් හඳුනාගත හැක (*Ic. Vol.* i. :1 - 25). සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දෙන ආකාරයට ශ්‍රී ලංකාව තුළින් බරත ලිපි 22ක් හඳුනාගෙන තිබේ (සෙනෙවිරත්න 1987 : 01).

විද්වතුන් කිහිප දෙනෙකුගේ යෝජනාවලට අනුව *බරත* යන පදය අදහස් රාශියකින් යුක්ත වේ. පාකර් දක්වා ඇති අදහස්වලට අනුව මෙම පදය සංස්කෘත *භෘටයන්තෙන්* බිඳී එන බැවින් එයින් *කම්කරුවා* යන්න ගම්‍ය වන බව ප්‍රකාශ කොට තිබේ (Parker,1909 : 436.no.05). වික්‍රමසිංහ මෙම පදය මගින් සංස්කෘත *භෘතෘහෙවත්ස්වාමියා*යන අරුත ඇති පදයෙන්

ප්‍රභවය වී ඇති බව ප්‍රකාශ කොට තිබේ (Wickramasinghe 1912 : 140 - 141). බෙල් ප්‍රකාශ කොට ඇති පරිදි ඉන්දියාවෙන් පැමිණි ජන කණ්ඩායමක් මෙයින් ගම්‍ය වන බව දක්වා තිබේ (Bell 1917 : 18 - 201). පරණවිතානගේ මතය වන්නේ *බරත* යන්නෙන් ස්වාමියා යන්න ගම්‍ය වන බවයි (*Ic.Vol.* i. 1970 : cv).ඔහු පෙන්වා දෙන ආකාරයට *බරත* යන පදයෙන් බත යන්න බිඳී ආ බව පෙන්වා දී ඇත (*එම*). මෙම අදහසට එල්ලාවල ද එකඟ වී තිබේ (Ellawala,1969 : 41).*බරත* යන පදය වෙනස් ම සන්දර්භයක ලා අර්ථ දක්වා ඇත්තේ මෙලෝනි විසිනි. ඔහු විසින් මෙම ජන කණ්ඩායම වයඹදිග ලංකාවේ හා අග්නිදිග තමිල්නාඩුවේ වෙරළබඩ ප්‍රදේශවල ජීවත් වන *පරවරජනයා* සමඟ සම්බන්ධතාවයක් පවතින බව පෙන්වා දී ඇත (සෙනෙවිරත්න,1987:68). ඔහුගේ විග්‍රහයට අනුව සංගම් සාහිත්‍යයේ *පරතවර්* මූලාරම්භය ප්‍රාග් ඓතිහාසික මධ්‍යශිලා යුගය දක්වා දිවයන බව ජනයා පිළිබඳ ව කර ඇති විස්තර හා *පරවර ජන කොටස* පිළිබඳ ව දැක්වෙන මානවවංස සටහන් මඟින් ද පෙන්වා දී ඇත (එම).

*පරවරජනයාගේ* මූලික සංස්කෘතික අනන්‍යතාවය සාගර සම්පත් මත රඳා පැවැත් වූ එකක් බැවින් ඔවුන්ගේ විශේෂ ප්‍රාගුණ්‍යතාවය හක් බෙල්ලන් හා මුතු ලබා ගැනීමේ කාර්යය හා බද්ධ ව පවතින බව ද පෙන්වා දී ඇත (*එම*: 69). ඒ අනුව පරවර ජනයා මුල් ඓතිහාසික අවධියේදී අන්තර් වෙරළ ප්‍රදේශ අතර හක් බෙල්ලන්, මුතු, මැණික් හා අශ්වයින් ඇතුළු වෙළඳ කටයුතුවල යෙදුණු බවට සාධක තිබෙන බව ද පෙන්වා දී ඇත (*එම*: 73). මහාවංසයේ මේ කාලපරිච්ඡේදය තුළ මදුරාපුරය සමඟ ශ්‍රී ලංකාවේ විජය රජු සිදුකළ ගනුදෙනු පිළිබඳ ව සඳහන් වේ (*මව.* vii : 49 - 52).




| | |
|---|---|
| UPK | - Upper Kala Oya |
| AMK | - Ambattakola |
| DO | - Demeda Oya |
| RG | - Rusigama |
| BG | - Bambaragala |
| AB | - Ambulabe |
| VG | - Vegiridevala |
| PR | - Poch Raja |
| MCR | - Mahachuda Raja |
| MK | - Manikaru |
| AB | - Aba Nagara |
| CN | - Chita Nagara |
| KG | - Kolagama |
| RDC | - Distribution Center |
| SG | - Sigiriya |
| DB | - Dambulla |
| KD | - Kandalama |
| VG | - Vapi Gama |
| MG | - Matugama |
| RG | - Rakithagama |
| AK | - Avkana |
| SMK | - Southern Market |
| EMK | - Estern Market |
| NMK | - Northern Market |
| WMK | - Western Market |
| APC | - Anuradhapura Citadel |
| MT | - Mantota |
| JKP | - Jambukola Pattana |

*රූප සටහන් අංක 02*

බරතයන් යනු කවුරුන්දැයි පිළිබඳ විග්‍රහය එසේ වුව ද ශ්‍රී ලංකාවේ බරතයන් ආශ්‍රිත වාණිජ සම්බන්ධතා රාශියක් පැවති බව හඳුනාගත හැකිය. ඒ අතරින් උතුරුමැද පළාතට අයත් පොළොන්නරු දිස්ත්‍රික්කයේ දූවේගලින් හමුවන බරත ශිලා ලිපියේ (*Ic*.Vol.i.no. 270)පසෙක නෞකාවක් හා එහි මුදුනේ නන්දිපාදයක් දැකගත හැක (*එම*. P1.xxv).එසේ ම පෙරියපුලියන්කුලමේ ලිපි දෙකකින් එකක නන්දිපාදයක්, ස්වස්තිකයක්, ත්‍රිකෝණයක් හා දරණුවක් දැකගත හැකිය (*එම*. no. 368, sim.16a, 12 I; 11a, xxvi). මෙයින් මුලින් විස්තර කළ no. 270 ලිපියේ නන්දිපාදය සහිත සංකේත තමිල්නාඩුවේ සාතවාහන කාසිවල ද දැකගත හැකි බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (සෙනෙවිරත්න, 1987 : 74). no. 270,368 ලිපිවල අඩංගු යාත්‍රා සංකේත මඟින් මොවුන් සමුද්‍ර ආශ්‍රිත වෙළඳාමේ නියුතු ජන කණ්ඩායමක් බව විශ්වාස කළ හැකිය (*එම*). එසේ ම කුරුණෑගල මිල්ලෑව විහාරයෙන් හමුවන no. 1049 ලිපිය මඟින් *බරතදූතක* යන්න පිළිබඳ සඳහන් වේ (*Ic*.Vol.i.no.1049). එමඟින් බරතවරුන් දූත කටයුතු සිදුකළ බව ද හඳුනාගත හැකිය.

මේ තත්ත්වයන්ට අනුව බරතවරු වෙළඳාම ආශ්‍රිත කටයුතුවල හා දූත කටයුතුවල නියැලුණු ජන කණ්ඩායමක් බව සෙනෙවිරත්නගේ මතයයි (සෙනෙවිරත්න,1987:74). අනුරාධපුරයට බරතවරුන්ගෙන් ලැබී ඇති දායකත්වය අභයගිරි විහාරයෙන් හමුවන *දමෙඩ ගහපති* ලිපියෙන් පැහැදිලි වේ. එම ලිපියේ සඳහන් වන *ඉළබරත* යන නම දකුණු ඉන්දියාවේ ක්‍රියාත්මක වරාය නගරයක් බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (සෙනෙවිරත්න,1987: 75). මෙම කාරණාවලට අනුව මුල් ඓතිහාසික අවධියේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳ ව බ්‍රාහ්මී අභිලේඛන ඇසුරින් කරුණු විග්‍රහ කිරීමෙන් පරුමකවරු, ගහපතිවරු, බරතවරු හා විවිධ ශිල්පීය කණ්ඩායම් අනුරාධපුර නාගරික ව්‍යුහය වඩා පුළුල් ආකාරයෙන් ගොඩනැගීම සඳහා විශාල දායකත්වයක් දක්වා ඇති බව හඳුනාගත හැකිය.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Reference)*

***Archaeological Survey of Ceylon*** (1892) - (Annual Report) by H.C.P. Bell, Government Printer: Ceylon.

***Inscription of Ceylon Vol I*** (1970)- Colombo, Department of Archaeology

Claessen, H.J.M. & P.Skalnik.(1978)- ***The Early State***,TheHugue: Mouton Publication

Coningham, R.A.E (1999) - ***Anuradhapura.The British-Sri Lanka excavations at Anuradhapura Salgaha Watta 2***.vol, England, Hadrian Books.Ltd. Oxford.

Deraniyagala,S.U.(1992) - ***The Prehistory of Sri Lanka*** ;An Ecological Perspective, Colombo, Archaeological Survey Department.

Ellawala,H. (1969)***Social History of Early Ceylon***, Colombo: Department of Cultural Affairs.Goldschmidt, P. 1879 - Notes on Ancient Sinhalese Inscription,***the Journal of the Ceylon Branch of the Royal Asiatic Society***. Vol XX: Colombo, 1-45.

Gunawardana, R.A.L.H(1981)- Social Function and political power: A case study of sate formation in Irrigation Society, ***The study of the state***, ed. Henri, J.M. Claessen and peter Skalnik, Hugue: Mouton: 133-154.

Hettiaratchy, Tilak (1972) - ***History of Kingship in Ceylon up to the Fourth century A.D.*** Colombo. Lake House Investment Limited

Karunathilake, P.V.B.(1983)- Early Sri Lankan Society - some Reflections on caste Social Groups and Ranking. The ***Sri Lanka Journal of the humanities.*** Vol 1 x. No 1 &2: 108-143

Manatanga, A.(1987)- Sri Lankave mul aithihasika purvana Nagara kihipayak (Some proto Urban sites of the Early Historic period in Sri Lanka), ***Paper presented at the second National Archaeological Congress***, Colombo: November

Mendis, T.(2007) - A New Cultural Road Map to Anuradhapura A Material cultural at Vessagiriya, ***Heritage Achievement***, Central Cultural Fund:16-20.

Parker,H. (1909) - ***Ancient Ceylon***, London Lucca & co.

Paranavitane,S.(1936)- ***The Excavation in the Citadel of Anuradhapura***, Memories of the Archaeological Survey of Ceylon, Colombo.

Perera,L.S.(1951)- The Brhami Inscription as a Source for the Study of the Early history of Ceylon, ***The historical Journal***, Vol I . No.02, 79-96.

Seneviratne , S. (1989)- Pre State Chieftain and Servants of the State : A case study of the parumuka. In ***the Sri Lanka Journal of Humanities***. Vol XV.No.1 & 2 99-131

Seneviratne , S. 1996- Peripheral Regions and Marginal Communities : Towards an Alternative Explanation of Early Iron age Maternal and social Organization in Sri Lanka ***Tradition Dissent and Ideology : Essay in Honor of Romila Thapar***, ed. K. Campakalakshmi and S.Gopal, Oxford University Press. Delhi: 265-312